සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

33 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- ※ අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු හිමි වේ.
- ※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ※ **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

විභාග අංකය : ..................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති.ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** ආයතනයක මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලියේදී පහත පියවරයන් සිදුවන **නිවැරදි** අනුපිළිවෙළ කුමක් ද?

A - අදාළ මූලික පොත්වල ගනුදෙනු සටහන් කිරීම.
B - මූලාශ්‍ර ලේඛන උපයෝගී කරගනිමින් ගනුදෙනු හඳුනාගැනීම.
C - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම.
D - මූලික පොත් උපයෝගී කරගනිමින් ගනුදෙනු පොදු ලෙජරයට පිටපත් කිරීම.

(1) A, B, C, D (2) A, B, D, C (3) B, A, C, D
(4) B, A, D, C (5) B, D, A, C (......)

- **අංක 2, 3 සහ 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

අරලිය එන්ටර්ප්‍රයිසස් ආහාර නිෂ්පාදනය කරන ආයතනයකි. පහත ගනුදෙනු සහ අයිතිකරු හා සම්බන්ධ සිදුවීම් 2025 අගෝස්තු මාසය තුළදී සිදු වී ඇත.

**A** - ආයතනයේ අයිතිකරු විසින් රු. 500 000 ක් වටිනා ඉඩමක් අතිරේක ප්‍රාග්ධනය ලෙස ලබා දී ඇත.
**B** - ආයතනය විසින් පිරිවැය රු. 240 000 ක් වූ ආහාර සැකසුම් කිරීමේ යන්ත්‍රයක් 2025.08.01 දින අත්පිට මුදලට මිල දී ගෙන එදිනම එය භාවිත කිරීම ආරම්භ කරන ලදී. එය මාස 24 ක කාලයක් තුළ ක්ෂය කරනු ලබයි.
**C** - 10% ක මුදල් වට්ටමක් ලැබීමෙන් පසුව වෙළෙඳ ණයහිමියෙකුට රු. 180 000 ක් ආයතනය විසින් ගෙවන ලදී.
**D** - රු. 15 000 ක පොලියක් ද ඇතුළත්ව රු. 60 000 ක මාසික ණය වාරිකය ආයතනය විසින් ගෙවන ලදී.
**E** - අයිතිකරුට පෞද්ගලිකව අයිති රු. 300 000 ක් වටිනා පරිගණකය ව්‍යාපාර පරිශ්‍රය තුළ තිබියදී සොරකම් කර ඇත.

**2.** ඉහත **A** සහ **E** සඳහා අරලිය එන්ටර්ප්‍රයිසස්හි ගිණුම් පොත්වල **නිවැරදි** ගිණුම්කරණ පිළිවෙත තීරණය කිරීමේදී පහත කුමන ගිණුම්කරණ සංකල්පය/සංකල්ප සලකා බලනු ලබයි ද?

(1) ඒකක (2) ගැළපුම් (3) ඒකක සහ ගැළපුම්
(4) ඒකක සහ විචක්ෂණ (5) ගැළපුම් සහ විචක්ෂණ (......)

**3.** 2025 අගෝස්තු මාසය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉහත කුමන ගනුදෙනු සඳහා ගැළපුම් සංකල්පය යොදා ගනු ලබයි ද?

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) B හා D පමණි.
(4) A, B හා E පමණි. (5) B, C හා D පමණි. (......)

Visit EDUHUB

**4.** අරලිය එන්ටප්‍රයිසස්හි 2025.08.31 දිනට ඉහත සියලුම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | වත්කම් (රු.'000) | = | වගකීම් (රු.'000) | + | හිමිකම (රු.'000) |
|---|---|---|---|---|---|
| (1) | -50 | | -245 | | +195 |
| (2) | -50 | | -243 | | +193 |
| (3) | -40 | | -245 | | +205 |
| (4) | +250 | | -245 | | +495 |
| (5) | +260 | | -245 | | +505 |

(……)

- **අංක 5, 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

රු. 300 000 ක මුදලක් ආයෝජනය කරමින් 2025.01.01 දින සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් වන විමල් ට්‍රේඩර්ස් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අතර සියලු මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් හරහා සිදු කරනු ලබයි. 2025 ජනවාරි මාසය තුළදී පහත ගනුදෙනු ව්‍යාපාරයේ සිදු වී ඇත.

- **A** - සම්පත් ට්‍රේඩර්ස් වෙතින් රු. 944 000 ක භාණ්ඩ ණයට මිල දී ගැනීම (රු. 144 000 ක VAT ඇතුළත්ව).
- **B** - රු. 177 000 කට මිල දී ගත් භාණ්ඩ සම්පත් ට්‍රේඩර්ස් වෙත ආපසු යැවීම (රු. 27 000 ක VAT ඇතුළත්ව).
- **C** - පිරිවැය රු. 600 000 ක් වූ භාණ්ඩ රු. 885 000 කට අත්පිට මුදලට විකිණීම (රු. 135 000 ක VAT ඇතුළත්ව).
- **D** - රු. 30 000 ක මුදල් වට්ටමක් ලැබීමෙන් පසුව සම්පත් ට්‍රේඩර්ස් වෙත ගෙවිය යුතු මුළු මුදල ගෙවීම.

**5.** විමල් ට්‍රේඩර්ස්හි මූලික සටහන් පොත්වල ඉහත **A, B, C** සහ **D** ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛන පිළිවෙළින්:

(1) ගැනුම් ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුචරය
(2) ගැනුම් ඉන්වොයිසිය, හරපත, තැන්පතු කුණ්ඩුව, ගෙවීම් වවුචරය
(3) ගැනුම් ඉන්වොයිසිය, බැරපත, ලදුපත, ගෙවීම් වවුචරය
(4) ගෙවීම් වවුචරය, හරපත, විකුණුම් ඉන්වොයිසිය, ජර්නල් වවුචරය
(5) ගෙවීම් වවුචරය, බැරපත, විකුණුම් ඉන්වොයිසිය, ජර්නල් වවුචරය (……)

**6.** 2025 ජනවාරි මාසය සඳහා විමල් ට්‍රේඩර්ස්හි ගැනුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීමේ **නිවැරදි** ද්විත්ව සටහන:

| | විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|---|
| (1) | ගැනුම් ගිණුම | 650 | |
| | VAT වියදම් ගිණුම | 117 | |
| | ණයහිමි පාලන ගිණුම | | 767 |
| (2) | ගැනුම් ගිණුම | 800 | |
| | VAT පාලන ගිණුම | 144 | |
| | ණයහිමි පාලන ගිණුම | | 944 |
| (3) | ගැනුම් ගිණුම | 767 | |
| | VAT පාලන ගිණුම | | 117 |
| | ණයහිමි පාලන ගිණුම | | 650 |
| (4) | ගැනුම් ගිණුම | 944 | |
| | VAT පාලන ගිණුම | | 144 |
| | ණයහිමි පාලන ගිණුම | | 800 |
| (5) | ගැනුම් ගිණුම | 800 | |
| | VAT වියදම් ගිණුම | 144 | |
| | ණයහිමි පාලන ගිණුම | | 944 |

(……)

**7.** විමල් ට්‍රේඩර්ස්හි 2025.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය සහ 2025.01.31 දිනට VAT පාලන ගිණුමේ ශේෂය:

| | ශුද්ධ ලාභය (රු.'000) | VAT පාලන ගිණුමේ ශේෂය (රු.'000) |
|---|---|---|
| (1) | 150 | හර 9 |
| (2) | 150 | බැර 18 |
| (3) | 180 | හර 18 |
| (4) | 180 | බැර 18 |
| (5) | 315 | හර 9 |

(……)

- අංක 8 සහ 9 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

දිමුතු ට්‍රේඩර්ස් සියලු මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් තුළින් සිදු කරනු ලබයි. 2025 ජනවාරි මාසය සඳහා ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනයෙන් උපුටාගත් තොරතුරුවල සාරාංශයක් පහත දී ඇත.

| | රු.'000 |
|---|---|
| 2025.01.01 දිනට ශේෂය - බැර | 100 |
| උපලබ්ධි වූ චෙක්පත් (2024.12.31 දින තැන්පත් කළ චෙක්පතක් ද ඇතුළත්ව) | 800 |
| සෘජු ප්‍රේෂණ - ආයෝජන ආදායම | 125 |
| ගෙවීම් සඳහා ඉදිරිපත් කළ චෙක්පත් | (600) |
| ස්ථාවර නියෝග ගෙවීම – රක්ෂණ වාරිකය | (60) |
| බැංකු ගාස්තු | (5) |
| 2025.01.31 දිනට ශේෂය - බැර | 360 |

අතිරේක තොරතුරු:

- 2025.01.01 දිනට ව්‍යාපාරයේ මුදල් ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය. 2024.12.31 දින බැංකුවේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු. 100 000 ක චෙක්පතක් මෙම වෙනසට හේතු විය.
- ව්‍යාපාරයේ මුදල් ගිණුමට අනුව 2025 ජනවාරි මාසය තුළ බැංකුවේ තැන්පත් කළ මුළු මුදල සහ චෙක්පත් මගින් කරන ලද මුළු මුදල් ගෙවීම් පිළිවෙළින් රු. 950 000 ක් සහ රු. 700 000 ක් විය.
- සෘජු ප්‍රේෂණ, ස්ථාවර නියෝග මත ගෙවීම් සහ බැංකු ගාස්තු මුදල් ගිණුමෙහි සටහන් කරනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව ය.
- 2025.01.31 දිනට ව්‍යාපාරයේ මුදල් ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය.

**8.** 2025.01.31 දිනෙන් අවසන් මාසය සඳහා දිමුතු ට්‍රේඩර්ස්හි මුදල් ගනුදෙනුවලට අදාළව පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - 2025.01.01 දිනට ව්‍යාපාරයේ මුදල් ගිණුමේ හර ශේෂය රු. 200 000 ක් විය.
B - මාසය තුළදී බැංකුවේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු.150 000 ක් විය.
C - මාසය අවසානය වන විට ගෙවීමට ඉදිරිපත් කර නොමැති චෙක්පත් රු.100 000 ක් විය.
D - මාසය සඳහා ව්‍යාපාරයේ මුළු මුදල් ලැබීම් රු. 1 075 000 ක් විය.

(1) A හා C පමණි. (2) B හා D පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය.

(......)

**9.** 2025.01.31 දිනට, බැංකු ප්‍රකාශනය ලැබීමට පෙර මුදල් ගිණුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසු මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය:

| | බැංකු ප්‍රකාශනය ලැබීමට පෙර මුදල් ගිණුමේ ශේෂය-හර (රු.'000) | මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය-හර (රු.'000) |
|---|---|---|
| (1) | 350 | 410 |
| (2) | 350 | 360 |
| (3) | 350 | 510 |
| (4) | 450 | 410 |
| (5) | 450 | 510 |

(......)

**10.** ඉමාලි ට්‍රේඩර්ස්, 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 250 000 ක දළ ලාභයක් සහ රු. 180 000 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. පිරිවැය මත 25% ක ලාභයක් පවත්වා ගනිමින් ඉමාලි ට්‍රේඩර්ස් විසින් භාණ්ඩ විකුණනු ලබයි. 2025 මාර්තු මාසය තුළදී, පිරිවැය රු. 15 000 ක් වූ භාණ්ඩ ව්‍යාපාරය විසින් 'විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම' මත යවන ලදී. කෙසේ වුව ද, මෙම භාණ්ඩවල මුළු විකුණුම් වටිනාකමම වැරදීමකින් විකුණුම් අයභාරය ලෙස ව්‍යාපාරය විසින් හඳුනාගෙන ඇත. මෙම භාණ්ඩවලින් පිරිවැය රු. 5 000 ක් වූ භාණ්ඩ 2025.03.31 දිනට නොවිකිණී තිබූ අතර, මේ සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් ගිණුම් පොත්වල සිදුකර නොතිබුණි. 2025.03.31 දිනට ව්‍යාපාරයේ අවසන් තොගය ආගණනය කර ඇත්තේ භෞතික තොගය මත පදනම්ව වන අතර එය තුළ මෙම විකුණා නොමැති භාණ්ඩ ඇතුළත් කර නොතිබුණි.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** දළ ලාභය සහ ශුද්ධ ලාභය:

| | දළ ලාභය (රු.) | ශුද්ධ ලාභය (රු.) |
|---|---|---|
| (1) | 238 750 | 168 750 |
| (2) | 248 750 | 173 750 |
| (3) | 248 750 | 178 750 |
| (4) | 248 750 | 180 000 |
| (5) | 261 250 | 191 250 |

(......)

Visit EDUHUB

**11.** සීමිත මිහිරි (පෞද්ගලික) සමාගම නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2025 ජනවාරි මාසය සඳහා මෙම ව්‍යාපාරයට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය මිල දී ගැනුම් | 750 |
| ගෙනඒමේ කුලී | 20 |
| 2025.01.01 දිනට අමුද්‍රව්‍ය තොගය | 80 |
| 2025.01.31 දිනට අමුද්‍රව්‍ය තොගය | 50 |
| සෘජු ශ්‍රමය | 300 |
| වෙනත් සෘජු පිරිවැය | 40 |
| කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය | 400 |
| 2025 ජනවාරි මාසය තුළදී නොනිමි තොගයේ වැඩිවීම | 50 |

**අතිරේක තොරතුරු:**

- නොනිමි තොගය නිෂ්පාදන පිරිවැය මත මිනුම් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

2025 ජනවාරි මාසය සඳහා ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය:

| | **ප්‍රාථමික පිරිවැය (රු.'000)** | **මුළු නිෂ්පාදන පිරිවැය (රු.'000)** |
|---|---|---|
| (1) | 1 080 | 1 430 |
| (2) | 1 100 | 1 450 |
| (3) | 1 100 | 1 550 |
| (4) | 1 140 | 1 490 |
| (5) | 1 140 | 1 590 |

(......)

**12.** නෙතුලි එන්ට්‍රප්‍රයිසස් ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් නොමැත. 2025.03.31 දිනට සහ 2024.03.31 දිනට ව්‍යාපාරයේ තොග සහ වෙළෙඳ ණයගැති ශේෂයන් පහත දී ඇත.

| | **2025.03.31 දිනට (රු.'000)** | **2024.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| තොග | 50 | 30 |
| වෙළෙඳ ණයගැතියෝ | ? | 190 |

ව්‍යාපාරයේ සියලු ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදුකරනු ලබයි. ව්‍යාපාරය විසින් විකුණුම් මිල මත 25% ක දළ ලාභ ආන්තිකයක් පවත්වාගනු ලබයි. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වෙළෙඳ ණයගැතියන්ගෙන් ලද මුළු මුදල සහ විකුණුම් පිරිවැය පිළිවෙළින් රු. 470 000 ක් සහ රු. 300 000 ක් විය.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගැනුම් සහ 2025.03.31 දිනට වෙළෙඳ ණයගැති ශේෂය:

| | **ගැනුම් (රු.'000)** | **වෙළෙඳ ණයගැතියෝ (රු.'000)** |
|---|---|---|
| (1) | 300 | 95 |
| (2) | 300 | 260 |
| (3) | 320 | 120 |
| (4) | 320 | 260 |
| (5) | 350 | 120 |

(......)

**13.** හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය සම්බන්ධව පහත කුමන ප්‍රකාශ නිවැරදි වේ ද?

A - හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස් වන විට කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබයි.
B - හවුල්කරුවන්ගේ ලාභාලාභ බෙදාගැනීමේ අනුපාතය වෙනස් වන විට කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබයි.
C - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබයි.
D - කීර්තිනාමය හවුල්කරුවන්ගේ හිමිකම තුළින් ගළපනු ලබයි.

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) C හා D පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (......)

- **අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සෑම්, රාම් සහ වාස් පිළිවෙළින් 5:3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2024.04.01 දිනට පහත ගිණුම් ශේෂයන් හවුල් ව්‍යාපාරයේ පැවතුණි.

| | **සෑම් (රු.'000)** | **රාම් (රු.'000)** | **වාස් (රු.'000)** |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් (බැර) | 6 000 | 4 000 | 2 000 |
| ජංගම ගිණුම් (බැර) | 800 | 400 | 200 |
| හවුල්කරුවන් විසින් ලබාදුන් පොලී රහිත ණය | 500 | – | 300 |

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය රු. 1 000 000 ක ශුද්ධ ලාභයක් උපයන ලදී. 2025.03.31 දින වාස් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය තක්සේරු කරන ලද අතර, එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපන ලදී. වාස්ගේ ණය මුදල ද ඇතුළුව විශ්‍රාම යෑමේදී ඔහුට ගෙවිය යුතු මුළු මුදල රු. 3 000 000 ක් වූ අතර මෙම මුදල ණය ගිණුමකට මාරු කිරීමට එකඟ විය. සෑම් සහ රාම් පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් නව හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය.

**14.** 2025.03.31 දින ඇස්තමේන්තු කරන ලද හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය (රු.'000):

(1) 1 500 (2) 2 500 (3) 3 000 (4) 3 500 (5) 4 000 (......)

Visit EDUHUB

**15.** වාස්ගේ විශ්‍රාම යාමෙන් පසුව 2025.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ හිමිකම (රු.'000):
(1) 9 700 (2) 10 900 (3) 11 700 (4) 11 800 (5) 11 900 (......)

● **අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සීමිත නුවන් පොදු සමාගමේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ මුළු විස්තීරණ ආදායම පිළිවෙළින් රු. 8 500 000 ක් සහ රු. 6 000 000 ක් විය.

ප්‍රවර්තන වර්ෂය තුළදී ඉඩම් සහ යන්ත්‍ර ප්‍රථම වරටත්, මෝටර් රථ දෙවන වරටත් ප්‍රත්‍යාගණනය කරන ලදී. ප්‍රවර්තන වර්ෂය තුළදී කළ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇති වූ අතිරික්තය හා හිඟයන් පහත පරිදි වේ.

| | **ප්‍රත්‍යාගණන අතිරික්තය/(හිඟය) (රු.'000)** |
|---|---|
| ඉඩම් | 2 000 |
| යන්ත්‍ර | (1 000) |
| මෝටර් රථ | (1 500) |

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය ලාභාලාභ ගිණුමේ වෙනත් ආදායම් තුළ හඳුනාගෙන ඇති අතර, ඉහත ප්‍රත්‍යාගණන හිඟයන් දෙකම වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනාගෙන ඇත. 2023.03.31 දින මෝටර් රථ ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එයින් රු. 1 200 000 ක අතිරික්තයක් ඇතිවූ අතර එය නිවැරදිව ගිණුම්ගත කර තිබුණි.

**16.** 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි වෙනත් විස්තීරණ ආදායම (රු.'000):
(1) (1 000) (2) 500 (3) 800 (4) 2 000 (5) 3 200 (......)

**17.** 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ලාභය සහ මුළු විස්තීරණ ආදායම:

| | **වර්ෂය සඳහා ලාභය (රු.'000)** | **මුළු විස්තීරණ ආදායම (රු.'000)** |
|---|---|---|
| (1) | 5 200 | 6 000 |
| (2) | 5 500 | 4 500 |
| (3) | 6 200 | 6 000 |
| (4) | 6 500 | 5 700 |
| (5) | 7 500 | 8 500 |

(......)

**18.** සීමිත කමල් පොදු සමාගම, 2024.04.01 දින සංස්ථාපනය කරන ලද අතර එය පරිගණක ආනයනය කර විකුණනු ලබයි. මෙම සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ආනයනය කරන ලද පරිගණක සඳහා පහත පිරිවැය දරන ලදී.

| | රු.'000 |
|---|---|
| පරිගණකවල ගැනුම් මිල | 55 000 |
| නැව් ගාස්තු සහ රක්ෂණය | 10 000 |
| ආනයන බදු | 15 000 |
| VAT | 12 000 |
| ගබඩා පිරිවැය | 18 000 |
| පරිගණක ආනයනය කිරීමට අදාළ පරිපාලන පොදුකාර්ය පිරිවැය | 10 000 |

**අතිරේක තොරතුරු:**

● 2025.03.31 දිනට මෙම පරිගණකවලින් 80% ක් නොවිකිණී තිබුණි.

'LKAS 2 - තොග' ප්‍රමිතයට අනුව, 2025.03.31 දිනට තොගයේ පිරිවැය (රු.'000):
(1) 64 000 (2) 73 600 (3) 80 000 (4) 88 000 (5) 96 000 (......)

**19.** 'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව, පහත කුමන ප්‍රකාශ නිවැරදි වේ ද?
A - ලද පොලිය, ආයෝජන මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කළ හැකි ය.
B - ගෙවූ පොලිය, මෙහෙයුම් මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කළ හැකි ය.
C - ලද ලාභාංශ, මෙහෙයුම් මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කළ හැකි ය.
D - ගෙවූ ලාභාංශ, මූල්‍ය මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කළ හැකි ය.

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි.
(4) A, B හා C පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (......)

**20.** 2024.04.01 දිනට සීමිත නතාශා පොදු සමාගමේ මුළු හිමිකම රු. 9 500 000 ක් විය. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| මුළු විස්තීරණ ආදායම | 5 500 |
| 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ප්‍රාග්ධනීත කළ රඳවාගත් ඉපැයුම් | 2 000 |
| සාමාන්‍ය කොටස්හිමියන් සඳහා ගෙවූ අතුරු ලාභාංශ | 800 |
| 2025.04.15 දින සාමාන්‍ය කොටස්හිමියන් සඳහා යෝජිත අවසාන ලාභාංශ | 1 000 |

ඉහත දී ඇති තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව 2025.03.31 දිනට නිවැරදි මුළු හිමිකම (රු.'000):
(1) 8 700 (2) 11 200 (3) 12 200 (4) 13 200 (5) 14 200 (......)

Visit EDUHUB

● අංක 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

සීමිත සුරංග පොදු සමාගම විශේෂ වර්ගයක විදුලි ජනන යන්ත්‍ර විකුණනු ලබන අතර මෙම යන්ත්‍ර ස්ථාපනය කිරීම සඳහා විශේෂඥ දැනුමක් අවශ්‍ය වේ. ඒ අනුව, මෙම යන්ත්‍ර ස්ථාපනය කිරීම සීමිත සුරංග පොදු සමාගම පමණක් සිදු කරනු ලබයි. තවද, විදුලි ජනන යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් මාස නවයකට පසුව, නඩත්තු සේවාවක් අවශ්‍ය වේ. වෙළෙඳපොළේ සිටින ඕනෑම විදුලි ජනන යන්ත්‍ර සැපයුම්කරුවකුට මෙම නඩත්තු සේවාව සැපයිය හැකි ය. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී මෙම සමාගම විසින් විකුණන ලද, ස්ථාපනය කරන ලද සහ නඩත්තු කරන ලද විදුලි ජනන යන්ත්‍රවලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | ප්‍රමාණය | ඒකකයක මිල/ගාස්තුව (රු.'000) |
|---|---|---|
| විකුණන ලද යන්ත්‍ර | 28 | 2 500 |
| ස්ථාපනය කළ යන්ත්‍ර | 24 | 500 |
| නඩත්තු සේවාව සම්පූර්ණ කළ යන්ත්‍ර | 12 | 400 |

**21.** 'SLFRS 15 - ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්' ප්‍රමිතයට අනුව, 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මුළු අයභාරය (රු.'000):
(1) 72 000 (2) 76 800 (3) 86 800 (4) 90 000 (5) 94 800 (……)

**22.** පහත අතිරේක තොරතුරු ද සපයා ඇත.
- ගනුදෙනුකරුවකු මෙම සමාගමෙන් විදුලි ජනන යන්ත්‍ර මිලදී ගෙන නඩත්තු සේවාව ද ලබාගැනීමට එකඟ වන්නේ නම් ඉහත දක්වා ඇති එක් එක් ඒකක මිලෙන් හෝ ගාස්තුවෙන් 10% ක වට්ටමක් ලබා දේ.
- වර්ෂය තුළ විකුණා ස්ථාපනය කළ යන්ත්‍ර 24 තුළ මෙම වට්ටමට යටත්ව විකුණූ යන්ත්‍ර 10 ක් ඇතුළත් වේ. කෙසේ වුව ද, වර්ෂය අවසාන වන විට, මෙම යන්ත්‍ර අතුරෙන් 6 කට පමණක් නඩත්තු සේවා සපයා ඇත.

මෙම වට්ටම සැලකිල්ලට ගත් විට, 'SLFRS 15 - ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්' ප්‍රමිතයට අනුව, 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මුළු අයභාරය (රු.'000):
(1) 73 560 (2) 76 800 (3) 83 560 (4) 85 560 (5) 86 800 (……)

● අංක 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

සාමාන්‍ය කොටස් 1 000 000 ක් නිකුත් කරමින් සංස්ථාපනය කරන ලද අතර එදිනම සමාගම විසින් වාර්ෂික පොලිය 5% ක් වන ණයකර ද නිකුත් කරන ලදී. සමාගමේ මෙයට අමතරව 2024.04.01 දින සීමිත ඉඳුවර පොදු සමාගම වෙනත් කිසිදු දිගුකාලීන වගකීමක් නොවී ය. පහත තොරතුරු ප්‍රවර්තන ගිණුම්කරණ කාලච්ඡේදයට අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| **2025.03.31 දිනට:** | |
| මුළු වත්කම් | 21 000 |
| මුළු හිමිකම | 12 000 |
| ජංගම වත්කම් | 3 000 |
| **2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | |
| විකුණුම් පිරිවැය | 4 500 |
| ආදායම් බදු වියදම | 540 |
| **2025.03.31 දිනට අතිරේක තොරතුරු:** | |
| හිමිකම මත ප්‍රතිලාභ (ROE) අනුපාතය | 18% |
| ණය හිමිකම් අනුපාතය | 60% |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1.25 |

2025.03.31 දිනට ඉදිරියට කළ ගෙවීම් හෝ උපචිත වියදම් හෝ නොවී ය.

**23.** 2025.03.31 දිනට කොටසක ඉපැයුම (EPS) :
(1) 1.98 (2) 2.16 (3) 2.70 (4) 3.24 (5) 3.60 (……)

**24.** තොග පිරිවැටුම් අනුපාතය (අවසාන තොගය මත පදනම්ව) සහ පොලී ආවරණ අනුපාතය:

| | තොග පිරිවැටුම් අනුපාතය (වාර) | පොලී ආවරණ අනුපාතය (වාර) |
|---|---|---|
| (1) | 5.5 | 6.5 |
| (2) | 6.0 | 5.5 |
| (3) | 6.0 | 8.5 |
| (4) | 8.5 | 6.0 |
| (5) | 12.0 | 8.5 |

(……)

**25.** පිරිවැය වර්ගීකරණයට අදාළව පහත කුමන සමීකරණ නිවැරදි වේ ද?

A මුළු විචල්‍ය පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + විචල්‍ය සෘජු ශ්‍රම පිරිවැය + විචල්‍ය වෙනත් සෘජු පිරිවැය + විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය + විචල්‍ය නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය

B මුළු පිරිවැය = ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය + නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය

C මුළු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + වෙනත් සෘජු පිරිවැය + මුළු පොදුකාර්ය පිරිවැය

D මුළු ස්ථාවර පිරිවැය = ස්ථාවර සෘජු ශ්‍රම පිරිවැය + ස්ථාවර වෙනත් සෘජු පිරිවැය + ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය + ස්ථාවර නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය

(1) A හා D පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (……)

[හත්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

**26.** ගංවතුර හේතුවෙන් සමාගමක වැටුප් ලේඛනය සම්පූර්ණයෙන්ම විනාශ වී ඇත. එබැවින්, 2025.06.30 දිනෙන් අවසන් මාසය සඳහා සමාගමට ලබාගත හැකි වූයේ පහත තොරතුරු පමණි.

- 2025 ජූනි මාසයට අදාළ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) යන දෙකම සඳහා ප්‍රේෂණය කරන ලද මුළු මුදල රු. 168 000 ක් විය.
- 2025 ජූනි මාසය සඳහා සේවකයන්ගේ මුළු ජීවන වියදම් දීමනාව රු. 120 000 ක් විය. සේවකයන්ට ලැබෙන එකම දීමනාව මෙය වේ.
- 2025 ජූනි මාසය සඳහා සේවකයන්ගේ වැටුපෙන් අඩුකරන ලද සුබසාධක සංගමයේ මුළු සාමාජික මුදල රු. 40 000 ක් විය.

**අතිරේක තොරතුරු:**

- EPF සඳහා සේව්‍ය සහ සේවක දායකත්වයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ.
- ETF සඳහා සේව්‍ය දායකත්වය 3% කි.
- සේවකයන්ගේ දළ වැටුප මත පදනම්ව EPF සහ ETF දායකත්වයන් ගණනය කරනු ලබයි.

2025.06.30 දිනෙන් අවසන් මාසය සඳහා සේවකයන්ගේ මූලික වැටුප සහ මුළු අඩු කිරීම්:

| | **මූලික වැටුප (රු.'000)** | **මුළු අඩු කිරීම් (රු.'000)** |
|---|---|---|
| (1) | 480 | 60 |
| (2) | 480 | 100 |
| (3) | 600 | 60 |
| (4) | 600 | 100 |
| (5) | 720 | 168 |

(......)

**27.** පොදුකාර්ය පිරිවැය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - විචල්‍ය පොදුකාර්ය පිරිවැය භාණ්ඩයකට සෘජුවම හඳුනාගත නොහැකි ය.

B - පිරිවැය මධ්‍යස්ථාන සඳහා රැස්කරන ලද පොදුකාර්ය පිරිවැය පිළිගත් පදනමක් මත පිරිවැය ඒකකවලට ඇතුළත් කිරීම පොදුකාර්ය පිරිවැය ප්‍රතිපාදනය ලෙස හැඳින්වේ.

C - නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය භාණ්ඩවලට අන්තර්ග්‍රහණය කළ යුතු වන්නේ ප්‍රාථමික පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස පමණි.

D - පොදුවේ දරන ලද නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය උචිත පදනම් භාවිත කරමින් පිරිවැය මධ්‍යස්ථාන අතර විභජනය කරනු ලබයි.

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) C හා D පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි.

(......)

**28.** භාණ්ඩයක පිරිවැය-පරිමා-ලාභ විශ්ලේෂණයට අනුව පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - සමච්ඡේදන ලක්ෂ්‍යයට ළඟාවීමට පෙර මුළු විචල්‍ය පිරිවැය, මුළු ආදායමට වඩා වැඩි වේ.

B - සමච්ඡේදන ලක්ෂ්‍යයේදී මුළු දායකය, මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

C - ආරක්ෂිත ආන්තික පරාසය තුළදී ලාභයක් උපයනු ලැබේ.

D - මුළු දායකයේ සහ මුළු විචල්‍ය පිරිවැයේ එකතුව මුළු ආදායමට සමාන වේ.

(1) A හා B පමණි. (2) B හා D පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ල ම ය.

(......)

**29.** සීමිත සිතුම් පොදු සමාගම තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබන අතර එහි වාර්ෂික ධාරිතා මට්ටම ඒකක 5 000 ක් වේ. පහත තොරතුරු මෙම භාණ්ඩයට අදාළ වේ.

- ක්‍රියාකාරී මට්ටම් ඒකක 1 000 සහ ඒකක 2 000 හිදී මුළු පිරිවැය පිළිවෙළින් රු. 200 000 ක් සහ රු. 250 000 ක් වේ.
- දායක විකුණුම් අනුපාතය 60% කි.
- ක්‍රියාකාරී මට්ටම ඒකක 2 500 ඉක්මවන්නේ නම්, සමාගමට රු. 50 000 ක අතිරේක ස්ථාවර පිරිවැයක් දැරීමට සිදුවනු ඇත.

ඒකක විචල්‍ය පිරිවැය සහ ක්‍රියාකාරී මට්ටම ඒකක 3 000 දී ලාභය/(අලාභය):

| | **ඒකක විචල්‍ය පිරිවැය (රු.)** | **ලාභය/(අලාභය) (රු.)** |
|---|---|---|
| (1) | 50 | 25 000 |
| (2) | 50 | 50 000 |
| (3) | 50 | (25 000) |
| (4) | 75 | 50 000 |
| (5) | 75 | (50 000) |

(......)

**30.** දිගුකාලීන ආයෝජන ව්‍යාපෘතියක් ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ව්‍යාපෘතියක මූලික ආයෝජනයේ අගය එහි වර්තමාන අගයට සමාන වේ.

B - ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය ශුන්‍ය වන විට, එම ව්‍යාපෘතිය එහි අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතයට සමාන ප්‍රතිලාභයක් ජනනය කරයි.

C - ව්‍යාපෘතියක් සඳහා වර්තමානයේදී ලැබෙන මුදලෙහි අගය, අනාගතයේදී ලැබෙන ඊට සමාන මුදලක අගයට වඩා වටිනාකමෙන් වැඩි වේ.

D - ශුද්ධ වර්තමාන අගය මත ව්‍යාපෘතියක් ඇගයීමේදී, එහි ආරම්භක ආයෝජනය නැවත ලබාගන්නා තෙක් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහ පමණක් සැලකිල්ලට ගනී.

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ල ම ය.

(......)



Visit EDUHUB

● අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

**31.** ආයතනයක ඇල්මැති පාර්ශ්වයන් විසින් පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවලින් තොරතුරු ලබාගන්නා අරමුණු කිහිපයක් පහත දී ඇත.

A - ආයතනයේ ලාභදායිත්වය ඇගයීමට

B - ආයතනයට එහි ණය පියවීම සඳහා ඇති හැකියාව ඇගයීමට

C - ආයතනය මත ආදායම් බදු පැනවීමට

D - ආයතනයට එහි සේවාවන් විශ්වසනීය ලෙස සැපයීම සඳහා ඇති හැකියාව ඇගයීමට

ඉහත සඳහන් කර ඇති එක් එක් අරමුණ සඳහා ගිණුම්කරණ තොරතුරු මූලිකව භාවිත කරන ඇල්මැති පාර්ශ්වය පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරන්න.

(1) ගනුදෙනුකරුවන් (2) රජය (3) ආයෝජකයන් (4) ණය. සැපයුම්කරුවන්

| අරමුණ | ඇල්මැති පාර්ශ්වය | අරමුණ | ඇල්මැති පාර්ශ්වය |
|---|---|---|---|
| A | ................................ | C | ................................ |
| B | ................................ | D | ................................ |

**32.** මධු එන්ට්‍රප්‍රයිසස් විසින් එහි මෙහෙයුම් කටයුතු 2024.03.31 දින ආරම්භ කරන ලද අතර මෙම ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම මූල්‍යනය කර ඇත්තේ රු. 400 000 ක බැංකු ණයක් මගිනි. 2025.03.31 දිනට පහත වත්කම්, වගකීම් සහ හිමිකම් ශේෂ පැවතුණි.

| වත්කම් (රු.'000) | වගකීම් (රු.'000) | හිමිකම (රු.'000) |
|---|---|---|
| 575 | 300 | 275 |

පහත තොරතුරු 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

- වර්ෂය තුළදී මුළු වත්කම් රු. 500 000 කින් වැඩි වී ඇති අතර මෙය තුළ ව්‍යාපාරයේ අයිතිකරු විසින් දායක වූ රු. 200 000 ක ප්‍රාග්ධනය ද ඇතුළත් වේ.
- අයිතිකරුගේ ගැනිලි රු. 25 000 ක්, බැංකු ණය ආපසු ගෙවීම් (ප්‍රාග්ධන කොටස) රු. 100 000 ක් සහ ව්‍යාපාරයේ වියදම් නිසා වර්ෂය තුළදී මුළු වත්කම් අඩු වී ඇත.
- ඉහත දක්වා ඇති ගනුදෙනු හැර වර්ෂය තුළදී වගකීම්වලට අදාළ වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු වී නොමැත.

පහත දෑ සඳහන් කරන්න.

(අ) 2024.03.31 දිනට වත්කම් (රු.'000) : ................................

(ආ) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය (රු.'000) : ................................

(ඉ) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් (රු.'000) : ................................

● අංක 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

මහා පරිමාණ එළවළු වගාවක යෙදෙන ව්‍යාපාරයක පහත ගනුදෙනු සිදුවී ඇත.

**A** - බීජ සැපයුම්කරුවකු වන අමල්ගෙන් රු. 800 000 ක බීජ එළවළු ණයට මිල දී ගැනීම.

**B** - රු. 2 300 000 ක අස්වනු නෙළීමේ යන්ත්‍රයක් සිමිත සිරිපාල (පෞද්ගලික) සමාගමෙන් ණයට මිල දී ගැනීම.

**C** - ආයතනයේ සේවකයන්ට රු. 100 000 ක වේතන ගෙවීම.

**D** - තොග වෙළෙඳුන්ට රු. 980 000 කට එළවළු තොග ණයට විකුණන ලද අතර මේ සඳහා රු. 200 000 ක මුදල් පසුව ලැබුණි. ඉතිරි මුදල මාසයක කාලයක් තුළදී ලැබීමට නියමිත ය.

**E** - එළවළු තොගයක් රු. 280 000 කට අමල්ට ණයට විකුණන ලද අතර මෙම මුදල බීජ එළවළු මිල දී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදලෙන් කොටසක් සඳහා හිලව් කිරීමට එකඟ විය.

**F** - අමල්ට ගෙවිය යුතු ඉතිරි මුදල ගෙවීම.

**33.** ඉහත **A, B, C** සහ **D** ගනුදෙනු සටහන් කිරීමට භාවිත කරන මූලික සටහන් පොත/පොත් සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලික සටහන් පොත/පොත් |
|---|---|
| A | ................................................ |
| B | ................................................ |
| C | ................................................ |
| D | ................................................ |



Visit EDUHUB

34. පහත දෑ සටහන් කිරීම සඳහා අවශ්‍ය ද්විත්ව සටහන් ලියන්න.

(අ) ආයතනයේ විකුණුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම

(ආ) අමල්ට ගෙවිය යුතු මුළු මුදල පියවීම

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| (අ) විකුණුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම: | | |
| (ආ) අමල්ට ගෙවිය යුතු මුළු මුදල පියවීම: | | |

35. ආයතනයක, පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලබන පහත එක් එක් ගිණුම් සඳහා සුදුසු 'මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය' සඳහන් කරන්න.

| ගිණුම | මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය |
|---|---|
| A - ගොඩනැගිලි කුලී | ............................................ |
| B - ආපසු එවුම් | ............................................ |
| C - වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය | ............................................ |
| D - වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය | ............................................ |

36. නිෂ්පාදන ආයතනයක පහත එක් එක් අවස්ථාවට **වඩාත්ම උචිත** ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| අවස්ථාව | ගිණුම්කරණ සංකල්පය |
|---|---|
| A - නිෂ්පාදන ක්‍රියාවලියේ භාවිත කරන යන්ත්‍ර සඳහා ක්ෂය, වියදමක් ලෙස හඳුනාගැනීම. | ............................ |
| B - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කිරීම. | ............................ |
| C - වර්ෂය තුළ දේපළ, පිරියත සහ උපකරණවල සිදු වූ වෙනස්වීම් නිරූපණය කිරීමට මූල්‍ය ප්‍රකාශනවල සටහනක් පිළියෙල කිරීම. | ............................ |
| D - දැනට විභාග වෙමින් පවතින නඩුවක් හේතුවෙන් ආයතනයට ලැබීමට අපේක්ෂිත රු. 500 000 ක වන්දියක් හඳුනා නොගැනීම. | ............................ |

37. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ක්‍රීඩා සමාජයක පහත ගනුදෙනු සිදු විය.

A - 2024.11.30 දින ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා රු. 300 000 ක පරිත්‍යාගයක් ලැබුණු අතර එය ක්‍රීඩා උපකරණ පරිත්‍යාග අරමුදල් ගිණුමට බැර කරන ලදී.

B - මෙම පරිත්‍යාගය භාවිත කරමින් 2025.01.01 දින රු. 200 000 ක් වටිනා ක්‍රීඩා උපකරණයක් අත්පිට මුදලට මිල දී ගැනීම. මෙම ක්‍රීඩා උපකරණයෙහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය වසර 5 කි.

C - මෙම පරිත්‍යාගය භාවිත කරමින් වෙනත් ක්‍රීඩා උපකරණයක් මිල දී ගැනීම සඳහා 2025.03.25 දින රු. 50 000 ක අත්තිකාරමක් ගෙවීම. මෙම ක්‍රීඩා උපකරණය 2025.04.05 දින ක්‍රීඩා සමාජයට ලැබෙනු ඇති බවට අපේක්ෂා කෙරේ.

ගිණුම් වර්ෂයක් තුළදී ගෙවීම් කිරීම සඳහා පරිත්‍යාග භාවිත කළ ප්‍රමාණයේ වටිනාකමට සමාන ප්‍රමාණයක් ආදායම ලෙස හඳුනා ගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා උපකරණ ක්ෂය සටහන් කිරීම සහ පරිත්‍යාග, ආදායම ලෙස හඳුනාගැනීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් ලියන්න.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| (1)<br><br>(2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ක්‍රීඩා උපකරණ ක්ෂය කිරීම) | | |
| (2)<br><br>(2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පරිත්‍යාග, ආදායම ලෙස හඳුනාගැනීම) | | |

[දෙවැනි පිටුව බලන්න.



Visit EDUHUB

- අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

අමල් සහ බිමල් පිළිවෙළින් 5:3 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. 2024.04.01 දින සිරිල් නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදී. මෙදිනට හවුල් ව්‍යාපාරයෙහි කීර්තිනාමය රු. 2 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපන ලදී. නව හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ අමල්, බිමල් සහ සිරිල් අතර පිළිවෙළින් 3:2:1 අනුපාතයට බෙදා ගැනේ.

2025.03.31 දිනට හවුල්කරුවන් තිදෙනාගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ පහත පරිදි විය.

| | අමල් (රු.'000) | බිමල් (රු.'000) | සිරිල් (රු.'000) |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 8 700 | 6 600 | 3 600 |

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. 2 820 000 ක් විය.
සෑම හවුල්කරුවකුම කීර්තිනාමය ගැළපීමෙන් පසු ලැබෙන ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.

**38.** කීර්තිනාමය ගැළපීමට පෙර 2024.04.01 දිනට අමල් සහ බිමල්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ සහ 2024.04.01 දින සිරිල් විසින් දායක වූ මුදල:

(අ) අමල් (රු.'000) : ..........................  (ආ) බිමල් (රු.'000) : ..........................
(ඉ) සිරිල් (රු.'000) : ..........................

**39.** 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අමල්ගේ සහ බිමල්ගේ ලාභ කොටස්:

(අ) අමල් (රු.'000) : ..........................  (ආ) බිමල් (රු.'000) : ..........................

**40.** මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට (2018) අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළියෙල කරනු ලබන්නේ වාර්තාකරණ ඒකකයට .............................. පවතී යන උපකල්පනය මත ය.

B - වියදමක් යනු හිමිකම් සඳහා අයිතිවාසිකම් දරන්නන්ට කරනු ලබන බෙදාහැරීමකින් තොරව .................... අඩුවීමක් හෝ .............................. වැඩිවීමක් හේතුවෙන් හිමිකමෙහි සිදුවන අඩුවීමකි.

C - මූල්‍ය තොරතුරු විශ්වසනීය ලෙස නිරූපණය කර ඇතැයි යන්න පිළිබඳව ස්වාධීන නිරීක්ෂකවරුන්ට එකඟතාවයක් ඇතිකර ගැනීමට හැකිවන 'වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ගතිලක්ෂණය' වන්නේ ..............................

**41.** 'LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව පහත එක් එක් ප්‍රකාශ **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **(F)** යන්න සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍ය / අසත්‍ය |
|---|---|---|
| A - | ආයතනයක් විසින් සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් අවම වශයෙන් වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු ය. | ............... |
| B - | වෙනත් ප්‍රමිතයකින් නියමකර හෝ අවසර දී ඇති අවස්ථාවක හැර ආයතනයක් විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු ය. | ............... |
| C - | මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් තුළ හෙළිදරව් කිරීම මගින් උචිත නොවන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආයතනයකට නිවැරදි කළ හැකි ය. | ............... |
| D - | වෙනත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් නියමකර හෝ අවසර දී ඇති පරිදි ලාභය හෝ අලාභය තුළ හඳුනා නොගත යුතු ආදායම් සහ වියදම් අයිතමවලින් වෙනත් විස්තීරණ ආදායම සමන්විත වේ. | ............... |

**42.** 2025.03.31 දිනට සීමිත රුවන් පොදු සමාගමට අදාළව විභාග වෙමින් පවතින නඩු දෙකක තොරතුරු පහත දී ඇත.

A - සේවයෙන් ඉවත් කරන අවස්ථාවේ දී ඇති වූ මතභේදයක් හේතුවෙන් හිටපු සේවකයෙකු විසින් රු. 8 000 000 ක වන්දියක් ඉල්ලමින් සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. සමාගමේ නීතිඥවරයාගේ මතයට අනුව සමාගම මෙම නඩුව පරාජය වීමට ඉතා ඉහළ සම්භාවිතාවයක් ඇති අතර රු. 6 000 000 ක වන්දියක් ගෙවීමට සමාගමට සිදුවනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

B - අඩු ගුණාත්මක තත්ත්වයක අමුද්‍රව්‍ය සැපයීම හේතුවෙන් රු. 5 000 000 ක වන්දියක් ඉල්ලමින් සමාගම විසින් එහි සැපයුම්කරුවකුට එරෙහිව නඩුවක් පවරා ඇත. සමාගමේ නීතිඥවරයාගේ මතයට අනුව සමාගමට මෙම නඩුව ජයගැනීමට ඉහළ සම්භාවිතාවක් පවතී.

ඉහත සඳහන් නඩුවලට අදාළව 'LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්' ප්‍රමිතයට අනුව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

A - 2025.03.31 දිනට සීමිත රුවන් පොදු සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. .............................. ක ප්‍රතිපාදනයක් .............................. යුතු ය.

B - රු. 5 000 000 ක .............................. ක් සීමිත රුවන් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන්හි .............................. තුළ හෙළිදරව් කළ යුතු ය.

[එකොළොස්වැනි පිටුව බලන්න.



Visit EDUHUB

**43.** 'SLFRS 16 - කල්බදු' ප්‍රමිතයට අනුව පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද (**T**) **අසත්‍ය** ද (**F**) යන්න සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය / අසත්‍ය |
|---|---|
| A - කල්බද්ද ආරම්භක දිනයේදී කල්බදු ගැනුම්කරු විසින් භාවිත අයිතිය සහිත වත්කම පිරිවැයට මිනුම් කළ යුතු වේ. | .............. |
| B - කල්බද්ද ආරම්භක දිනයේදී කල්බදු ගැනුම්කරු විසින් කල්බදු වගකීම පිරිවැයට මිනුම් කළ යුතු වේ. | .............. |
| C - කල්බද්ද ආරම්භක දිනයට පසුව කල්බදු ගැනුම්කරු විසින් භාවිත අයිතිය සහිත වත්කම පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය යොදාගනිමින් මිනුම් කළ හැකි ය. | .............. |
| D - කල්බදු කාල සීමාව අවසානයේ කල්බදු වත්කමේ අයිතිය කල්බදු ගැනුම්කරුට මාරුවන අවස්ථාවක වත්කමේ ඵලදායී ජීවකාලය මත පදනම්ව භාවිත අයිතිය සහිත වත්කම ක්ෂය කළ යුතු ය. | .............. |

**44.** 'LKAS 16 - දේපළ, පිරියත හා උපකරණ' ප්‍රමිතයට අනුව, පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

A - ක්ෂය යනු වත්කමක ............................................ එහි ඵලදායී ජීවකාලය තුළ ක්‍රමානුකූලව බෙදාහැරීමයි.

B - වත්කමක් .................................................................. විට එය ක්ෂය කිරීම ආරම්භ කළ යුතු ය.

C - අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කමක ඵලදායී ජීවකාලය සහ ........................ සමාලෝචනය කළ යුතු වේ.

D - කාලච්ඡේදයකට අදාළ ක්ෂය වියදම, ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතු වන්නේ එය වෙනත් වත්කමක .................................................................................... තුළ ඇතුළත් කර නොමැති නම් පමණි.

**45.** උචිත ගිණුම්කරණ අනුපාත භාවිත කරමින් පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

A - ආයතනයක් ණය ප්‍රාග්ධනය මත දැඩිව රඳා පවතින බව ඉහළ ........................................ අනුපාතයක් මගින් පෙන්නුම් කරනු ලබයි.

B - ආයතනයක් විසින් එහි වෙළෙඳ ණයගැතියන්ගෙන් කාර්යක්ෂමව මුදල් එකතු කර ගන්නා බව ඉහළ ........................................................ අනුපාතයක් මගින් පෙන්නුම් කරයි.

C - ආයතනයක ...................... අනුපාතය එහි ...................... අනුපාතයට වඩා සැලකිය යුතු ලෙස අඩු වී ඇති විට, කෙටිකාලීන වගකීම් පියවීම සඳහා ආයතනයට තොග විකිණීම මත රඳා පැවතීමට සිදුවන බව පෙන්නුම් කෙරේ.

**46.** විශේෂ කේක් වර්ගයක් සඳහා බේකරි නිෂ්පාදන සමාගමක් ලද ඇණවුමකට අදාළව පහත පිරිවැය දී ඇත. තවද මෙම කේක් ඇණවුම ලබාගැනීම සඳහා මෙම සමාගම දැනටමත් රු. 120 000 ක විකුණුම් ප්‍රවර්ධන පිරිවැයක් දරා ඇත.

| **පිරිවැය අයිතමය** | **රු.'000** |
|---|---|
| පිටි, සීනි සහ බටර් පිරිවැය | 550 |
| බේකරි සේවකයන් සඳහා අතිකාල දීමනා | 100 |
| විශේෂිත කේක් වර්ගයේ ඇසුරුම් පිරිවැය | 50 |

**අතිරේක තොරතුරු:**

| | **රු.'000** |
|---|---|
| • ස්ථිර බේකරි සේවකයන්ගේ මාසික වැටුප් | 600 |
| • බේකරියේ මාසික කුලිය | 300 |

මෙම කේක් ඇණවුම සඳහා පහත එක් එක් පිරිවැය දක්වන්න.

(අ) ගිලුණු පිරිවැය (රු.'000) : ..................................

(ආ) මුළු අදාළ පිරිවැය (රු.'000) : ..................................

(ඉ) මුළු අදාළ නොවන පිරිවැය (රු.'000) : ..................................

**47.** පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද (**T**) **අසත්‍ය** ද (**F**) යන්න සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය / අසත්‍ය |
|---|---|
| A - ආයතනයක ගැනුම් දෙපාර්තමේන්තුව විසින් ගැනුම් අධියාචනා පත්‍රය පිළියෙල කරනු ලබයි. | .............. |
| B - උද්ධමනකාරී තත්ත්වයක් යටතේ, තොග අගය කිරීම සඳහා පෙර-පිවිසි පෙර-පිට ක්‍රමය (FIFO) භාවිත කළවිට තොගයේ පිරිවැය, භරිත සාමාන්‍ය ක්‍රමයේදී ලැබෙන අගයට වඩා වැඩි ය. | .............. |
| C - තොග අයිතමයක ආර්ථික ඇණවුම් ප්‍රමාණය වන්නේ එහි වාර්ෂික ඇණවුම් පිරිවැයෙහි සහ වාර්ෂික රඳවාගැනීමේ පිරිවැයෙහි එකතුව අවම වන යළි ඇණවුම් ප්‍රමාණයයි. | .............. |
| D - එක් එක් තොග අයිතමයේ ලැබීම්, නිකුත් කිරීම් සහ ශේෂය, ප්‍රමාණයෙන් සහ වටිනාකමින් යන දෙකෙන්ම සටහන් කරන ලේඛනය බින් කාඩ් පත්‍රය වේ. | .............. |

[දොළොස්වැනි පිටුව බලන්න.



Visit EDUHUB

**48.** සීමිත දසුන් පොදු සමාගම නිෂ්පාදන සමාගමක් වන අතර, එය යන්ත්‍ර සහ එකලස් නම් වූ පිරිවැය මධ්‍යස්ථාන දෙකකින් සමන්විත වේ. සමාගම තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරයි. මෙම සමාගමේ ඒකක 30 000 ක ක්‍රියාකාරී මට්ටමේදී පහත තොරතුරු දී ඇත.

| | |
|---|---|
| විකුණුම් මිල | ඒකකයක් සඳහා රු. 400 |
| ශුද්ධ ලාභ අනුපාතය | 25% |
| සෘජු අමුද්‍රව්‍ය පිරිවැය | ඒකකයක් සඳහා රු. 50 |
| සෘජු ශ්‍රම පිරිවැය | ඒකකයක් සඳහා රු. 35 |

| | පිරිවැය මධ්‍යස්ථානය - යන්ත්‍ර | පිරිවැය මධ්‍යස්ථානය - එකලස් |
|---|---|---|
| පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය | යන්ත්‍ර පැයක් සඳහා රු. 25 | සෘජු ශ්‍රම පැයක් සඳහා රු. 20 |
| සැකසුම් කිරීමේ කාලය (ඒකකයක් සඳහා) | යන්ත්‍ර පැය 3 | සෘජු ශ්‍රම පැය 2 |

- සමාගමේ ආරම්භක හෝ අවසාන තොග නොතිබුණි.

පහත දෑ දක්වන්න.

(අ) ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය (රු.) :..........................................

(ආ) ක්‍රියාකාරී මට්ටම ඒකක 30 000 කදී මුළු නිෂ්පාදන පිරිවැය (රු.'000) :..........................................

(ඉ) ක්‍රියාකාරී මට්ටම ඒකක 30 000 කදී ඒකකයක් සඳහා නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය (රු.) : ..................

**49.** ඒකක 25 000 ක නිෂ්පාදන ධාරිතාවයක් සහිත සමාගමක් විසින් නිෂ්පාදනය කර විකුණනු ලබන තනි භාණ්ඩයකට අදාළව පුරෝකථනය කළ තොරතුරු පහත දී ඇත.

| | |
|---|---|
| දායක විකුණුම් අනුපාතය | 40% |
| ආරක්ෂිත ආන්තිකය (ඒකක සහ වටිනාකම) | ඒකක 9 000 සහ රු. 450 000 |
| මුළු ස්ථාවර පිරිවැය | රු. 120 000 |

පහත දෑ සඳහන් කරන්න.

(අ) ඒකකයක විකුණුම් මිල (රු.) : ..........................................

(ආ) සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකකවලින්) : ..........................................

(ඉ) ක්‍රියාකාරී මට්ටම ඒකක 15 000 ක් වන විට ලාභය/(අලාභය) (රු.'000) : ..........................................

**50.** සමාගමක් විසින් එහි පැරණි යන්ත්‍රයක් වෙනුවට වසර 10 ක අපේක්ෂිත ඵලදායී ජීවකාලයක් සහිත නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටියි. මේ සම්බන්ධයෙන් පුරෝකථනය කළ තොරතුරු පහත දී ඇත.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| නව යන්ත්‍රයේ පිරිවැය | 12 000 |
| නව යන්ත්‍රයේ සුන්බුන් අගය | 2 000 |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 800 |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් වියදම | 50 |
| අතිරේක කාරක ප්‍රාග්ධනය (මෙම මුදල ව්‍යාපෘති කාලය අවසානයේදී අයකර ගත හැකි ය.) | 2 500 |
| නව යන්ත්‍රය නිසා අඩුවන වාර්ෂික මෙහෙයුම් මුදල් ගලා යෑම් | 1 000 |
| නව යන්ත්‍රය නිසා වැඩිවන වාර්ෂික ආදායම | 1 250 |

මෙම ව්‍යාපෘතිය සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) ආරම්භක ශුද්ධ මුදල් ගලා යාම (රු.'000) : ..........................................

(ආ) පිළිගෙවුම් කාලය (වසර) : ..........................................

(ඉ) මුළු පර්යන්ත ශුද්ධ මුදල් ගලා ඒම් (රු.'000) : ..........................................

* * *

15

සියලු ම හිමිකම් ඇවිරිණි / முழு

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025**
**General Certificate of Education (Adv. Level) Examination, 2025**

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

**33 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.**

**වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

**උපදෙස්:**
- ❊ **පළමුවන** හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ❊ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- ❊ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- ❊ මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

**1.** සීමිත ජනක පොදු සමාගම නිෂ්පාදන සමාගමක් වන අතර, එය තනි භාණ්ඩයක් නිපදවනු ලබයි. මෙම සමාගම 2024.04.01 දින සංස්ථාපනය කරන ලදී. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශනය පහත දී ඇත.

**2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ආදායම් ප්‍රකාශනය**

| | රු.'000 |
|---|---|
| විකුණුම් අයභාරය | 92 000 |
| විකුණුම් පිරිවැය | (40 000) |
| දළ ලාභය | 52 000 |
| වෙනත් ආදායම් | 4 500 |
| මෙහෙයුම් වියදම් | (32 500) |
| බදු පසු ලාභය | **24 000** |

**කෙටුම්පත් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමෙන් පසුව 2025.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම**

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| නිෂ්පාදන පිරියත - ප්‍රත්‍යාගණිත අගය | 80 000 | |
| කාර්යාල උපකරණ - පිරිවැය | 50 000 | |
| සමුච්චිත ක්ෂය : | | |
| නිෂ්පාදන පිරියත | | 6 000 |
| කාර්යාල උපකරණ | | 10 000 |
| භාවිත අයිතිය සහිත වත්කම | 28 000 | |
| තොගය - නිමි භාණ්ඩ | 10 000 | |
| මුදල් | 2 500 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 25 800 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 20 000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය-සාමාන්‍ය කොටස් | | 125 000 |
| බදු පසු ලාභය | | 24 000 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 12 500 |
| ගෙවූ අතුරු ලාභාංශ | 1 200 | |
| | **197 500** | **197 500** |



Visit EDUHUB

**අතිරේක තොරතුරු:**

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළියෙල කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතු වේ.

(i) කෙටුම්පත් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී භාවිත කළ මෙහෙයුම් පිරිවැයෙහි සංයුතිය පහත පරිදි වේ.

| | රු.'000 |
|---|---|
| පරිපාලන වියදම් | 6 500 |
| බෙදාහැරීමේ පිරිවැය | 6 900 |
| නිෂ්පාදන පිරියත ක්ෂය | 6 000 |
| කාර්යාල උපකරණ ක්ෂය | 10 000 |
| කර්මාන්තශාලා ගොඩනැගිලි කුලිය | 2 000 |
| ස්ව තක්සේරුව යටතේ ගෙවූ ආදායම් බදු | 1 100 |
| මුළු මෙහෙයුම් වියදම් | 32 500 |

සමහර නිෂ්පාදන වියදම්ද ඇතුළුව වියදම් අයිතම කිහිපයක් වැරදීමකින් ඉහත මෙහෙයුම් වියදම් තුළ අඩංගු කර ඇත.

(ii) ශේෂ පිරික්සුමේ දක්වා ඇති තොගය ආගණනය කර ඇත්තේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ඇතැම් නිෂ්පාදන වියදම් ඇතුළත් නොකිරීම හේතුවෙන් වැරදි ලෙස ගණනය කළ නිෂ්පාදන පිරිවැය මත ය. නිමි භාණ්ඩ තොගයේ පිරිවැය, නිෂ්පාදන පිරිවැයෙන් 1/5 කට සමාන වේ. 2025,03.31 දිනට අමුද්‍රව්‍ය හෝ නොනිමි තොග නොතිබුණි.

(iii) අධ්‍යක්ෂ ගාස්තු රු. 7 500 000 ක් සහ විගණන ගාස්තු රු. 2 100 000 ක් 2025.03.31 දිනට ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොතිබුණි.

(iv) දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ තොරතුරු පහත පරිදි වේ.

- සියලු දේපළ, පිරියත සහ උපකරණ අයිතම සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර ඒවා මිල දී ගත් දින සිට භාවිතය සඳහා පැවතුනි.
- 2025.03.31 දින නිෂ්පාදන පිරියත එහි වෙළෙඳපොළ වටිනාකම වූ රු. 80 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. කෙසේ වුවද, ශේෂ පිරික්සුමේ දක්වා ඇති ප්‍රත්‍යාගණන අතිරික්තය ගණනය කර ඇත්තේ ප්‍රත්‍යාගණන වටිනාකම සහ නිෂ්පාදන පිරියතයේ පිරිවැය යන දෙකෙහි වෙනස පමණක් සැලකිල්ලට ගෙන ය. 2024.04.01 දින මෙම පිරියතය අත්පත් කර ගන්නා ලදී. එදිනට මෙම නිෂ්පාදන පිරියතයේ ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 10 ක් සහ රු. 7 500 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.
- කාර්යාල උපකරණවලට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| අත්පත්කර ගත් දිනය | පිරිවැය (රු.'000) | ඵලදායී ජීවකාලය (වර්ෂ) |
|---|---|---|
| 2024.04.01 | 30 000 | 5 |
| 2024.10.01 | 20 000 | 5 |
| **මුළු පිරිවැය** | **50 000** | |

කාර්යාල උපකරණවල ඇස්තමේන්තුගත සුන්බුන් අගය ශුන්‍ය වේ. අත්පත් කරගත් දිනය සැලකිල්ලට නොගෙන මුළු වර්ෂය සඳහාම කාර්යාල උපකරණ ක්ෂය කර ඇත.

(v) මෝටර් රථයක භාවිත අයිතිය ලබාගැනීම සඳහා 2024.04.01 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹෙන ලද අතර මෙදින රු. 20 000 000 ක මූලික ගෙවීමක් කරන ලදී. 2024.04.01 දිනට මුළු කල්බදු වාරිකවල වර්තමාන අගය රු. 30 000 000 ක් විය. කල්බදු ගිවිසුමට අනුව රු. 8 000 000 ක් බැගින් වූ සමාන වාර්ෂික කල්බදු වාරික 5 ක් කල්බදු කාලසීමාව තුළදී ගෙවිය යුතු අතර පළමු වාරිකය 2025.03.31 දින ගෙවන ලදී. කල්බදු කාලසීමාව අවසානයේදී මෝටර් රථයේ අයිතිය කල්බදු ගැනුම්කරුට මාරු නොවේ. මෝටර් රථයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය වර්ෂ 8 ක් වන අතර සුන්බුන් අගය ශුන්‍ය වේ. 2025.03.31 දිනෙන් සහ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා අදාළ කල්බදු පොලිය පිළිවෙළින් රු. 3 126 000 ක් සහ රු. 2 618 000 ක් වේ. මූලික ගෙවීම සහ ගෙවූ ප්‍රථම කල්බදු වාරිකය, භාවිත අයිතිය සහිත වත්කම් ගිණුමට හර කර ඇති අතර මුදල් ගිණුමට බැර කර ඇත. මෙම කල්බද්ද සඳහා වෙනත් කිසිදු ගිණුම් සටහනක් තබා නොමැත. මෙම මෝටර් රථය භාණ්ඩ බෙදාහැරීම සඳහා යොදා ගැනේ.

(vi) 2025.03.31 දිනට ගෙවිය යුතු ආදායම් බදු රු. 550 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(vii) සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2025.05.31 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමැතිය ලබාදුන් අතර, පහත සිදුවීම් 2025.03.31 දිනට පසුව සිදු වී ඇත.

- ගනුදෙනුකරුවකු විසින් සමාගමට එරෙහිව ගොනු කරන ලද නඩුවක තීන්දුව 2025.04.30 දින ලබාදෙන ලදී. ඒ අනුව ගෙවිය යුතු වන්දිය සම්පූර්ණයෙන්ම පියවීම සඳහා රු. 600 000 ක් සමාගම විසින් මෙදින ගෙවන ලදී. මෙම නඩුව 2024.12.10 දින ගොනුකර තිබුණි.

[තුන්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

- 2025.03.31 දිනට පැවති වෙළෙඳ ණයගැතියෙක් බුන්වත් වී ඇති බව උසාවිය විසින් 2025.05.15 දින ප්‍රකාශයට පත් කරන ලදී. ශේෂ පිරික්සුමේ දක්වා ඇති වෙළෙඳ ලැබිය යුතු දෑ තුළ මෙම ණයගැතියාගෙන් ලැබිය යුතු රු. 3 500 000 ක් ඇතුළත් විය. සිහිකැඳවීම් තිහිපයක් සිදු කිරීමෙන් පසුව, සමාගමට මෙම ණයගැතියාගෙන් රු. 1 200 000 ක් පමණක් 2025.05.01 දින ලබාගත හැකි විය.
- 2025.05.25 දින සාමාන්‍ය කොටස්හිමියන් සඳහා රු. 500 000 ක අවසාන ලාභාංශයක් අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා කරන ලදී.

**අවශ්‍ය වන්නේ:**

'LKAS 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත ජනක පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව) ;

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය **(මුළු ලකුණු 40 යි)**

**2. (අ)** නදුන් ඇඟලුම් (පෞද්ගලික) සමාගම එහි සේවකයන්ට වැටුප් ගෙවීම සඳහා කාල අදනම මෙන්ම නිමැවුම් පදනම භාවිත කරයි. 2025 සැප්තැම්බර් මාසය සඳහා සේවක අර්ථසාධක අරමුදලට (EPF) සිදුකළ දායකයන් පහත පරිදි වේ.

| සේවකයාගේ නම සහ තනතුර | සේවක අංකය | EPF දායකය (රු.) සේව්‍ය (12%) | සේවකයා (8%) | එකතුව |
|---|---|---|---|---|
| සිල්වා (කළමනාකරු) | 01 | 16 200 | 10 800 | 27 000 |
| ප්‍රනාන්දු (යන්ත්‍ර ක්‍රියාකරු) | 02 | 14 160 | 9 440 | 23 600 |
| කුමාර (යන්ත්‍ර ක්‍රියාකරු) | 03 | 9 600 | 6 400 | 16 000 |
| නදීශා (තත්ත්ව පාලක) | 04 | 9 120 | 6 080 | 15 200 |
| එකතුව | | 49 080 | 32 720 | 81 800 |

**අතිරේක තොරතුරු:**

(i) කළමනාකරුට රු. 108 000 ක මාසික මූලික වැටුපක් ගෙවනු ලබයි. අනිකුත් සේවකයන්ගේ මූලික වැටුප නිමැවුම් පදනම මත ගෙවනු ලබයි.

(ii) සියලුම දීමනාවන්ද ඇතුළත්ව දළ වැටුප මත EPF සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායකයන් ගණනය කරනු ලබයි. ETF සඳහා සේව්‍ය දායකත්වය 3% කි.

(iii) රු. 17 000 ක් වූ මාසික ජීවන වියදම් දීමනාවක් සෑම සේවකයකුටම ගෙවනු ලැබේ.

(iv) කළමනාකරුට මාසික ජීවන වියදම් දීමනාවට අමතරව ස්ථාවර මාසික ගමන් වියදම් දීමනාවක්ද ගෙවනු ලැබේ.

(v) යන්ත්‍ර ක්‍රියාකරුවන්ට පහත දක්වා ඇති පරිදි නිමැවුම් පදනම මත මූලික වැටුප ගෙවනු ලැබේ. මෙයට අමතරව යන්ත්‍ර ක්‍රියාකරුවන්ට ඔවුන්ගේ කාර්යසාධනය මත පදනම්ව නිෂ්පාදන දීමනාවක් ගෙවනු ලැබේ.

| සේවකයා | ඒකක | ඒකකයක් සඳහා මේවරය (රු.) | නිෂ්පාදන දීමනාව (රු.) |
|---|---|---|---|
| ප්‍රනාන්දු | 350 | 250 | ? |
| කුමාර | 240 | 250 | ? |

(vi) නිෂ්පාදනය කළ මුළු ඒකක 590 හි ගුණත්වය සහතික කිරීම වෙනුවෙන් තත්ත්ව පාලකට ඒකකයකට රු. 100 බැගින් වූ මේවයක් ගෙවා ඇත.

(vii) ප්‍රනාන්දු සහ නදීශා කාර්ය මණ්ඩල ණය ලබාගෙන ඇති අතර, ඔවුන්ගේ මාසික ණය වාරික සඳහා අඩු කිරීම් පිළිවෙළින් රු. 12 500 ක් සහ රු. 5 000 ක් වේ.

**අවශ්‍ය වන්නේ:**

2025 සැප්තැම්බර් මාසය සඳහා සීමිත නදුන් ඇඟලුම් (පෞද්ගලික) සමාගමේ වැටුප් ලේඛනය . **(ලකුණු 10 යි)**

**(ආ)** සීමිත ජෝන් පොදු සමාගම 'A' සහ 'B' නම් වූ වර්ග දෙකක මෙට්ට නිෂ්පාදනය කරනු ලබයි. 'යන්ත්‍ර' සහ 'නිමැවුම්' නම් වූ නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් සහ 'ගබඩාව' යන සේවා දෙපාර්තමේන්තුවකින් මෙම සමාගම සමන්විත වේ. මෙම සියලු දෙපාර්තමේන්තු එකම ගොඩනැඟිල්ලක් තුළ පිහිටුවා ඇත. මෙම සමාගමේ අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටම මෙට්ට 5 000 ක් වන අතර එය 'A' වර්ගයේ 3 000 කින් ද 'B' වර්ගයේ 2 000 කින් ද සමන්විත වේ.

යන්ත්‍ර දෙපාර්තමේන්තුවේ සහ නිමැවුම් දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත පිළිවෙළින් යන්ත්‍ර පැය සහ සෘජු ශ්‍රම පැය මත ගණනය කරනු ලබයි.

පහත දී ඇති පරිදි සමාගම විසින් පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත දැනටමත් ගණනය කර ඇත.

| | යන්ත්‍ර | නිමැවුම් |
|---|---|---|
| පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය | යන්ත්‍ර පැයකට රු. 300 | සෘජු ශ්‍රම පැයකට රු. 200 |
| අයවැයගත යන්ත්‍ර පැය | 30 000 | 2 000 |
| අයවැයගත සෘජු ශ්‍රම පැය | 1 000 | 20 000 |

[අනෙක් පිටුව බලන්න.

Visit EDUHUB

කෙසේ වුවද, සමාගමේ කළමනාකරුවන් විසින් පසුව සිදුකරන ලද විමර්ශනයකදී මෙම පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාවේ පහත වැරදි සහ අත්හැරීම් සොයාගන්නා ලදී. තවද පොදුකාර්ය පිරිවැය විභජන පදනම් කිහිපයක් සඳහා සංශෝධනද කළමනාකරුවන් විසින් යෝජනා කරන ලදී.

- යන්ත්‍ර සහ නිමැවුම් දෙපාර්තමේන්තුවලට අදාළ අයවැයගත වක්‍ර වේතන පිළිවෙළින් රු. 1 000 000 ක් සහ රු. 2 000 000 ක් විය. කෙසේ වුවද, මෙම වටිනාකම් වැරදීමකින් යන්ත්‍ර දෙපාර්තමේන්තුවට රු. 2 000 000 ක් ලෙසද නිමැවුම් දෙපාර්තමේන්තුවට රු. 1 000 000 ක් ලෙස ද වෙන්කර ඇත.
- යන්ත්‍ර සහ නිමැවුම් දෙපාර්තමේන්තු සඳහා පිළිවෙළින් රු. 3 140 000 ක් සහ රු. 1 860 000 ක් වූ යන්ත්‍ර සඳහා රක්ෂණ වාරික, පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැත.
- අදාළ දෙපාර්තමේන්තු සඳහා වඩා සුදුසු පොදුකාර්ය පිරිවැය නිරූපණයක් ලබාදීමට පහත සඳහන් සංශෝධිත පොදුකාර්ය පිරිවැය විභජන පදනම් සඳහා යෝජනා කර ඇත.

| පොදුකාර්ය පිරිවැය වර්ගය | භාවිත කළ පදනම | යෝජිත පදනම |
|---|---|---|
| යන්ත්‍ර ක්ෂය | යන්ත්‍ර පිරිවැය | යන්ත්‍ර ධාරණ වටිනාකම |
| කර්මාන්තශාලා විදුලි වියදම් | භූමි ප්‍රමාණය (වර්ග මීටර්) | විදුලි පරිභෝජනය (කිලෝවොට් පැය) |

- තවද, ගබඩා දෙපාර්තමේන්තුවේ මුළු පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට නැවත විභජනය කිරීමේ පදනම පහත පරිදි වෙනස් කිරීමට යෝජනා කර ඇත.

| භාවිත කළ පදනම | යෝජිත පදනම |
|---|---|
| නිකුත් කළ ගබඩා අධියාචනා පත්‍ර ගණන | අමුද්‍රව්‍ය පරිභෝජන අනුපාතය |

- පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන ඇති ගබඩා දෙපාර්තමේන්තුවේ අයවැයගත මුළු පොදුකාර්ය පිරිවැය රු. 2 000 000 ක් විය.

**අතිරේක තොරතුරු:**

- පහත තොරතුරු පොදුකාර්ය පිරිවැය විභජන සහ නැවත විභජන පදනම්වලට අදාළ වේ.

| | යන්ත්‍ර | නිමැවුම් | ගබඩා |
|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය (රු.'000) | 8 000 | 6 000 | 4 000 |
| යන්ත්‍ර ධාරණ වටිනාකම (රු.'000) | 6 000 | 2 000 | 1 000 |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 3 000 | 2 000 | 1 000 |
| විදුලි පරිභෝජනය (කිලෝවොට් පැය) | 5 000 | 500 | 500 |
| නිකුත් කළ ගබඩා අධියාචනා පත්‍ර ගණන | 150 | 100 | – |
| අමුද්‍රව්‍ය පරිභෝජන අනුපාතය | 80% | 20% | – |

- අයවැයගත වාර්ෂික යන්ත්‍ර ක්ෂය සහ අයවැයගත කර්මාන්තශාලා විදුලි වියදම් පිළිවෙළින් රු. 2 250 000 ක් සහ රු. 600 000 ක් වේ.
- 'A' වර්ගයේ මෙට්ට ඒකකයක් නිෂ්පාදනය සඳහා සෘජු පිරිවැය :

  සෘජු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 4 ක් කිලෝ ග්‍රෑමයක් රු. 450 ක් බැගින්

  සෘජු ශ්‍රම පැය 2 ක් පැයකට රු. 400 බැගින්
- 'A' වර්ගයේ මෙට්ටයක් සැකසීමේ කාලය යන්ත්‍ර දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර පැය 2 ක් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවේ සෘජු ශ්‍රම පැය 2 ක් වේ.
- නිෂ්පාදන පිරිවැය මත 40% ක ලාභයක් එකතුකර විකුණුම් මිල තීරණය කරනු ලබයි.
- කාලච්ඡේදය සඳහා අයවැයගත නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය රු. 1 500 000 ක් වන අතර, එය සමානව මෙට්ට වර්ග දෙක අතර බෙදාහරිනු ලැබේ.

**අවශ්‍ය වන්නේ:**

(1) පහත දෑ පැහැදිලිව දක්වමින් සංශෝධිත පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව :

(i) එක් එක් දෙපාර්තමේන්තුව සඳහා දැනටමත් ගණනය කර ඇති මුළු පොදුකාර්ය පිරිවැය

(ii) කළමනාකරුවන් හඳුනාගත් වැරදි සහ අත්හැරීම් නිවැරදි කිරීම

(iii) පොදුකාර්ය පිරිවැය විභජන පදනම්වල යෝජිත සංශෝධන සඳහා ගැළපීම

(iv) ගබඩා දෙපාර්තමේන්තුවේ මුළු පොදුකාර්ය පිරිවැය නැවත විභජනය කිරීමෙන් පසු එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා මුළු පොදුකාර්ය පිරිවැය

(2) යන්ත්‍ර සහ නිමැවුම් දෙපාර්තමේන්තු සඳහා සංශෝධිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) 'A' වර්ගයේ මෙට්ටයක් සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය

(4) 'A' වර්ගයේ මෙට්ටයක් සඳහා නිෂ්පාදන පිරිවැය

(5) 'A' වර්ගයේ මෙට්ට සඳහා ඒකක 3 000 ක ක්‍රියාකාරී මට්ටමේදී ලාභය

**(ලකුණු 30 යි)**

**(මුළු ලකුණු 40 යි)**

3. (අ) තොග වෙළෙඳ සමාගමක් වන සන්රයිස් ට්‍රේඩින් (පෞද්ගලික) සමාගම 2023 වර්ෂයේදී පිහිටුවන ලදී. මෙම සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. 2025.04.01 දිනට සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත පරිදි වේ.

| | රු. මිලියන |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 600 |
| තොගය | 220 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 60 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 130 |
| **මුළු වත්කම්** | **1 010** |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 600 |
| රඳවාගත් ඉපැයුම් | 200 |
| බැංකු ණය | 100 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 70 |
| ගෙවිය යුතු VAT | 40 |
| **හිමිකම සහ මුළු වගකීම්** | **1 010** |

2025.06.30 දිනෙන් අවසන් කාර්තුව තුළදී පහත ගනුදෙනු මෙම සමාගමේ සිදු වී ඇත.

| අංකය | ගනුදෙනුව |
|---|---|
| 1 | රු. මිලියන 59 කට භාණ්ඩ ණයට මිල දී ගැනීම (රු. මිලියන 9 ක VAT ඇතුළත්ව). |
| 2 | රු. මිලියන 118 කට භාණ්ඩ ණයට විකිණීම (රු. මිලියන 18 ක VAT ඇතුළත්ව). මෙම භාණ්ඩවල පිරිවැය රු. මිලියන 70 කි. |
| 3 | රු. මිලියන 29.5 කට කලින් විකුණන ලද භාණ්ඩ ආපසු ලැබීම (රු. මිලියන 4.5 ක VAT ඇතුළත්ව). මෙම භාණ්ඩවල පිරිවැය රු. මිලියන 16 ක් විය. |
| 4 | රු. මිලියන 60 ක් වූ වෙළෙඳ ණයහිමියන් රු. මිලියන 10 ක වට්ටමක් ලැබීමෙන් පසුව පියවීම. |
| 5 | රු. මිලියන 5 ක වට්ටමක් ලබා දීමෙන් පසුව රු. මිලියන 75 ක් වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම. |
| 6 | මෙම කාර්තුව සඳහා රු. මිලියන 10 ක පොලී වියදමද ඇතුළත්ව රු. මිලියන 50 ක බැංකු ණය වාරිකය ගෙවීම. |
| 7 | රු. මිලියන 12 ක නව යන්ත්‍රයක් අත්පිට මුදලට මිල දී ගන්නා ලද අතර, මෙම යන්ත්‍රයේ මූලික පරීක්ෂණ වටය සඳහා අමුද්‍රව්‍ය පිරිවැය වූ රු. මිලියන 1 ක්ද ගෙවන ලදී. |
| 8 | මෙම කාර්තුවට අදාළ රු. මිලියන 3 ක විදුලි ගාස්තු ගෙවීම. |
| 9 | ව්‍යාපාර ප්‍රවර්ධන ක්‍රියාකාරකමක් ලෙස පිරිවැය රු. මිලියන 2 ක භාණ්ඩ පාසලකට පරිත්‍යාග කිරීම. |
| 10 | රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරමින් රු. මිලියන 25 ක සාමාන්‍ය කොටස් නිකුත් කිරීම. |
| 11 | 2025.04.01 දිනට ගෙවිය යුතු VAT රු. මිලියන 40 දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම. |
| 12 | කළමනාකරණ අධ්‍යක්ෂගේ පෞද්ගලික ආදායම් බදු සඳහා රු. මිලියන 4 ක් සමාගම විසින් ගෙවීම. |
| 13 | ස්ව තක්සේරු පදනම මත මෙම කාර්තුව සඳහා ගණනය කළ රු. මිලියන 8 ක ආදායම් බදු ගෙවීම. |
| 14 | මෙම කාර්තුව සඳහා දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය රු. මිලියන 14 ක් වෙන් කිරීම. |

**අවශ්‍ය වන්නේ:**

(1) 2025.04.01 දිනට ශේෂ සටහන් කර අංක 1 සිට 14 දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. ගැනුම්, විකුණුම් හා ආපසු එවුම් යන සියල්ලම මත VAT, ගිණුම්කරණ සමීකරණයේ VAT පාලන තීරුවේ සටහන් කළ යුතු වේ. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න).

(රු. මිලියන)

| ශේෂය / ගනුදෙනු අංකය | වත්කම් | | | | = වගකීම් | | | + හිමිකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | මුදල් සහ මුදල් සමාන දෑ | බැංකු ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | VAT පාලන | සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයුම් |
| 2025.04.01 දිනට ශේෂය | | | | | | | | | |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| ---- | | | | | | | | | |
| ---- | | | | | | | | | |
| 2025.06.30 දිනට ශේෂය | | | | | | | | | |

(2) 2025.06.30 දිනෙන් අවසන් කාර්තුව සඳහා ශුද්ධ ලාභය (රඳවාගත් ඉපැයුම් තීරුව මත පදනම්ව)

**(ලකුණු 25 යි)**

[හතරවැනි පිටුව බලන්න.



Visit EDUHUB

**(ආ)** පිද්ම ක්‍රීඩා සමාජයේ පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | 2025.03.31 දිනට (රු.'000) | 2024.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| සමුච්චිත අරමුදල | ? | 900 |
| යාවජීව සාමාජික අරමුදල | 320 | 400 |
| ක්‍රීඩා උපකරණ අරමුදල | ? | 800 |
| ගොඩනැගිලි අරමුදල | 2 000 | – |
| දේපළ, පිරියත හා උපකරණ - ධාරණ වටිනාකම | 1 350 | 1 500 |
| ගොඩනැගිලි නොනිමි වැඩ | 300 | – |
| හිඟහිටි සාමාජික මුදල් | ? | 30 |

**අතිරේක තොරතුරු:**

(i) 2024.03.31 දිනට ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 60 දෙනෙකු සිටි අතර, ඔවුන්ගෙන් 10 දෙනෙකු යාවජීව සාමාජිකයන් වේ. යාවජීව සාමාජිකත්වය ක්‍රීඩා සමාජයේ ආරම්භක සාමාජිකයන්ට සීමා වේ.

(ii) යාවජීව සාමාජික මුදල් වාර්ෂිකව ආදායම ලෙස හඳුනා ගැනේ.

(iii) එක් සාමාජිකයකු සඳහා වාර්ෂික සාමාජික මුදල රු. 12 000 ක් වේ. මෙම වාර්ෂික සාමාජික මුදල එකවර වර්ෂය ආරම්භයේදී හෝ මාසිකව රු. 1 000 බැගින් සමාන වටිනාකම්වලින් ගෙවිය හැකි ය. වර්ෂය ආරම්භයේදී වාර්ෂික සාමාජික මුදල එකවර ගෙවූ විට 10% ක වට්ටමක් සාමාජිකයන්ට ලබාදෙන අතර, ලද ශුද්ධ සාමාජික මුදල, ආදායම ලෙස හඳුනාගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

(iv) 2024.04.01 දින නව සාමාජිකයන් 15 දෙනෙකු ක්‍රීඩා සමාජයට බැඳුණි. නව සාමාජිකයකු ක්‍රීඩා සමාජයට බැඳෙන විට රු. 5 000 ක ඇතුළත්වීමේ ගාස්තුවක් ගෙවිය යුතු වේ. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සාමාජිකයන් 40 දෙනෙකු (නව සාමාජිකයන් 15 දෙනා ද ඇතුළුව) වාර්ෂික සාමාජික මුදල එකවර වර්ෂය ආරම්භයේදී ගෙවන ලදී. ඉතිරි සාමාජිකයන් සාමාජික මුදල් මාසික පදනම මත ගෙවන ලදී. මෙම සාමාජිකයන් අතුරෙන් 5 දෙනෙකු මාස 09 කට පමණක් සාමාජික මුදල් ගෙවන ලද අතර ඉතිරි සාමාජිකයන් මුළු වර්ෂය සඳහාම සාමාජික මුදල් ගෙවන ලදී. 2024.03.31 දිනට හිඟහිටි සාමාජික මුදල් වර්ෂය තුළදී ලැබුණි.

(v) පරිත්‍යාග භාවිත කළ සහ භාවිත කිරීමට එකඟ වී ඇති ප්‍රමාණයන්හි එකතුව මත ආදායම ලෙස හඳුනාගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

(vi) ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා පසුගිය වර්ෂයක ලද පරිත්‍යාගයක් ක්‍රීඩා උපකරණ අරමුදල ලෙස හඳුනාගෙන ඇත. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ක්‍රීඩා සමාජය විසින් පිරිවැය රු. 400 000 ක ක්‍රීඩා උපකරණ අත්පිට මුදලට මිල දී ගන්නා ලදී. මෙම මිල දී ගැනීම වෙනුවෙන් රු. 300 000 ක් ක්‍රීඩා උපකරණ අරමුදලින් භාවිත කරන ලදී.

(vii) ගෘහස්ථ ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට 2025.01.01 දින ලද රු. 2 000 000 ක පරිත්‍යාගයක් ගොඩනැගිලි අරමුදල ලෙස හඳුනාගෙන ඇත. මෙම ක්‍රීඩාංගණයේ සැලසුම පිළියෙල කිරීමට 2025.01.20 දින රු. 150 000 ක පිරිවැයක් ක්‍රීඩා සමාජය විසින් ගෙවන ලද අතර 2025.03.01 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. ඉදිකිරීමේ කටයුතු සඳහා රු. 300 000 ක් වූ ප්‍රථම ගෙවීම 2025.03.31 දිනට ගෙවිය යුතු විය. මෙම මුදල 2025.04.10 දින ගෙවන ලදී. මෙම ඉදිකිරීමට අදාළ සියලු පිරිවැය දැරීම සඳහා ගොඩනැගිලි අරමුදල භාවිත කෙරේ.

(viii) ප්‍රවර්තන වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ මෙහෙයුම් වියදම රු. 550 000 ක් ලෙස ගණනය කර ඇති අතර, මෙය තුළ ගෘහස්ථ ක්‍රීඩාංගණයේ සැලසුම් පිරිවැයද ඇතුළත් වේ. කෙසේ වුවද, දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය මෙම වියදම් තුළ ඇතුළත් වී නොමැත.

(ix) ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම හැර වෙනත් දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීමක් හෝ ඉවත් කිරීමක් හෝ මෙම වර්ෂය තුළදී සිදු වී නොමැත.

**අවශ්‍ය වන්නේ:**

ක්‍රීඩා සමාජයට අදාළව:

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම

(2) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(3) 2025.03.31 දිනට හිමිකම (එක් එක් අයිතමය වෙන වෙනම දක්වන්න)

**(ලකුණු 15 යි)**

**(මුළු ලකුණු 40 යි)**

[හත්වැනි පිටුව බලන්න.

Visit EDUHUB

**4.** **(අ)** 2025.01.01 දින නාරද ට්‍රේඩර්ස් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය ණය පදනම මත සමහරක් භාණ්ඩ මිල දී ගනු ලබන අතර, භාණ්ඩ විකිණීම ණය පදනමට මෙන්ම අත්පිට මුදලටද සිදු කරයි. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. පහත ගනුදෙනු 2025 ජනවාරි මාසයේ දී ව්‍යාපාරය විසින් සිදු කර ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2025.01.01 | අයිතිකරු විසින් මුදලින් රු. 200 000 ක් සහ රු. 480 000 ක් වටිනා ලී බඩු, ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී. |
| | රු. 600 000 ක බැංකු ණයක් 12% ක වාර්ෂික ණය පොලියකට ලබා ගන්නා ලදී. |
| 2025.01.05 | රු. 472 000 ක භාණ්ඩ දසුන්ගෙන් ණයට මිල දී ගන්නා ලදී (රු. 72 000 ක VAT ඇතුළත්ව). |
| 2025.01.07 | රු. 118 000 ක භාණ්ඩ අත්පිට මුදලට විකුණන ලදී (රු.18 000 ක VAT ඇතුළත්ව). |
| 2025.01.12 | රු. 236 000 ක භාණ්ඩ බිනරට ණයට විකුණන ලදී (රු. 36 000 ක VAT ඇතුළත්ව). |
| 2025.01.15 | රු. 531 000 ක භාණ්ඩ අරුන්ගෙන් ණයට මිල දී ගන්නා ලදී (රු. 81 000 ක VAT ඇතුළත්ව). |
| 2025.01.20 | රු. 590 000 ක භාණ්ඩ සඳුන්ට ණයට විකුණන ලදී (රු. 90 000 ක VAT ඇතුළත්ව). |
| 2025.01.22 | බිනරගෙන් ලැබිය යුතු මුළු මුදල් ලැබුණි. |
| 2025.01.25 | රු. 10 000 ක වට්ටමක් ලැබීමෙන් පසුව දසුන්ට ගෙවිය යුතු මුළු මුදල පියවන ලදී. |
| 2025.01.28 | රු. 140 000 ක මෙහෙයුම් වියදම් ගෙවන ලදී. |
| 2025.01.31 | රු. 6 000 ක පොලිය ද ඇතුළත්ව රු. 13 000 ක් වූ මාසික බැංකු ණය වාරිකය ගෙවන ලදී. |

**අතිරේක තොරතුරු:**

- 2025.01.01 දින සිට ලී බඩු භාවිතය සඳහා පැවතුණි. එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය වසර 5 ක් වන අතර සුන්බුන් අගය ශුන්‍ය වේ.

**අවශ්‍ය වන්නේ:**

(1) 2025 ජනවාරි මාසය සඳහා පහත මූලික සටහන් පොත්:
(i) මුදල් ලැබීම් ජර්නලය (ii) මුදල් ගෙවීම් ජර්නලය (iii) විකුණුම් ජර්නලය
(iv) ගැනුම් ජර්නලය (v) පොදු ජර්නලය

(2) මූලික සටහන් පොත්වල එකතුන් පොදු ලෙජරයට පිටපත් කිරීමට ජර්නල් සටහන් (*සංලක්ෂණය අවශ්‍ය වේ*)

(3) 2025 ජනවාරි මාසය සඳහා පොදු ලෙජරයේ පහත ගිණුම්:
(i) මුදල් ගිණුම (ii) VAT පාලන ගිණුම (iii) බැංකු ණය ගිණුම **(ලකුණු 25 යි)**

**(ආ)** නිෂ්පාදන සමාගමක් දැනට තිබෙන යන්ත්‍රයක් වෙනුවට ඉහළ තාක්ෂණයෙන් යුත් යන්ත්‍රයක් ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් සලකා බලමින් සිටියි. මෙම නව යන්ත්‍රය වර්ෂ 5 ක කාලයක් සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරයි. මේ සම්බන්ධයෙන් පහත ඇස්තමේන්තුගත තොරතුරු සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| නව යන්ත්‍රයේ ගැනුම් මිල | 11 000 |
| නව යන්ත්‍රය ස්ථාපනය කිරීමේ සහ ප්‍රවාහන පිරිවැය | 1 000 |
| අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව | 2 200 |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 1 200 |
| පැරණි යන්ත්‍රයේ ධාරණ වටිනාකම | 400 |
| පැරණි යන්ත්‍රය විකිණීමෙන් ඇති වන ලාභය මත ගෙවිය යුතු බදු | 250 |
| ව්‍යාපෘති කාලය අවසානයේදී නව යන්ත්‍රයේ සුන්බුන් අගය | 2 000 |

**අතිරේක තොරතුරු:**

- ව්‍යාපෘති කාලය අවසානයේදී අමතර කාරක ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් අය කර ගත හැකි ය.
- නව යන්ත්‍රය මිල දී ගන්නේ නම්, පළමු වර්ෂයේදී අපේක්ෂිත වාර්ෂික මුදල් ගලාඒම රු. 5 000 000 ක් වන අතර, ඉන් පසුව මෙම වටිනාකම ව්‍යාපෘතියේ සෑම වර්ෂයකදීම 10% බැගින් වැඩි වේ.
- ව්‍යාපෘතියේ අපේක්ෂිත මෙහෙයුම් වියදම් (වාර්ෂික ක්ෂය ද ඇතුළත්ව) පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් වියදම් (රු.'000) | 2 900 | 2 900 | 2 950 | 3 050 | 3 120.5 |

- සමාගම සරල මාර්ග ක්‍රමය භාවිත කරමින් වත්කම් ක්ෂය කරනු ලබයි.
- සමාගමේ ආදායම් බදු අනුපාතය වාර්ෂික ලාභය මත 20% ක් වන අතර, ආදායම් බදු සෑම වර්ෂයක් අවසානයේදීම ගෙවිය යුතු වේ.
- ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 12% ක් වන අතර එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය (ආසන්න දශම ස්ථාන දෙකකට) | 0.89 | 0.80 | 0.71 | 0.64 | 0.57 |

**අවශ්‍ය වන්නේ:**

(1) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මූලික සහ වාර්ෂික මුදල් ගලාඒම් සහ ගලායෑම් (*එක් එක් මුදල් ප්‍රවාහ අයිතමය වෙන වෙනම දක්වමින්*)
(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV)
(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව ව්‍යාපෘතියෙහි ආයෝජනය කිරීම සඳහා නිර්දේශය
(4) ව්‍යාපෘතියේ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (*සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව*) **(ලකුණු 15 යි)**

**(මුළු ලකුණු 40 යි)**

[අවසාන පිටුව බලන්න.

Visit EDUHUB

5. (අ) බාලන් සහ සීලන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක හවුල්කරුවන් වූහ. ඔවුන් ලාභ සහ අලාභ සම සමව බෙදා ගන්නා ලදී. මෙම හවුල්කරුවන් විසින් 2024.04.01 දින දීපාල් සහ එමිල් යන නව හවුල්කරුවන් දෙදෙනා බඳවා ගනිමින් ව්‍යාපාරය වැඩිදියුණු කිරීමට එකඟ විය. නව හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- බාලන්, සීලන්, දීපාල් සහ එමිල් අතර ලාභ සහ අලාභ පිළිවෙළින් 2:2:1:1 අනුපාතයට බෙදා ගනී.
- වර්ෂය අවසානයේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත 10% වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.
- සෑම හවුල්කරුවකුම රු. 1 200 000 ක වාර්ෂික වේතනයකට හිමිකම් ලබන අතර එය මුදල් ගෙවීමෙන් හෝ ව්‍යාපාරයේ වෙළෙඳ භාණ්ඩ, පිරිවැයට ලබා දීමෙන් හෝ පියවිය හැකි ය.
- මෙම ගිවිසුමේ ආවරණය කර නොමැති කරුණු සඳහා 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ කොන්දේසි භාවිත කිරීමට හවුල්කරුවන් එකඟ විය.

2025.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි විය.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| විකුණුම් අයභාරය | | 30 000 |
| විකුණුම් පිරිවැය | 8 000 | |
| පරිපාලන වියදම් | 8 000 | |
| බෙදාහැරීමේ සහ වෙනත් වියදම් | 3 000 | |
| මුදල් | 1 000 | |
| තොගය | 2 000 | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 26 000 | |
| 2024.04.01 දින බාලන් විසින් ලබා දුන් ණය | | 2 000 |
| 2024.04.01 දිනට ජංගම ගිණුම් : බාලන් | | 600 |
| සීලන් | | 400 |
| 2024.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් : බාලන් | | 4 000 |
| සීලන් | | 4 000 |
| දීපාල් ගෙනඑන ලද මුදල් | | 2 000 |
| එමිල් ගෙනඑන ලද මුදල් | | 1 000 |
| එමිල් ගෙනඑන ලද වෙළෙඳ තොගය | | 4 000 |
| | **48 000** | **48 000** |

**අතිරේක තොරතුරු:**

(i) 2024.04.01 දින දීපාල් සහ එමිල් ගෙනඑන ලද වත්කම්:

| වත්කම | දීපාල් (රු.'000) | එමිල් (රු.'000) |
|---|---|---|
| ඉඩම | 3 000 | – |
| වෙළෙඳ තොගය | – | 4 000 |
| මුදල් | 2 000 | 1 000 |
| **එකතුව** | **5 000** | **5 000** |

(ii) නව හවුල්කරුවන් දෙදෙනාම ගෙනඑන ලද මුදල් සහ එමිල් ගෙනඑන ලද වෙළෙඳ තොගය පමණක් පොත්වල සටහන් කර ඇත. දීපාල් ලබාදුන් ඉඩම පොත්වල සටහන් කර නොතිබුණි. දීපාල් ලබාදුන් ඉඩම ව්‍යාපාරයේ රථගාලක් ලෙස භාවිත කරන අතර එමිල් ගෙනඑන ලද තොගය අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනාගාරයට ලබාදෙන ලදී.

(iii) නව හවුල්කරුවන් බඳවාගත් දිනයේදී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 2 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළ සටහන් කර නොතිබුණි.

(iv) වර්ෂය තුළදී හවුල්කරුවන් සඳහා වේතන ගෙවීම් පහත පරිදි වේ.

| හවුල්කරු | මුදලින් ගෙවීම් (රු.'000) | වෙළෙඳ භාණ්ඩ මගින් පියවීම් (රු.'000) | මුළු වේතන ගෙවීම් (රු.'000) |
|---|---|---|---|
| බාලන් | 1 200 | – | 1 200 |
| සීලන් | 800 | – | 800 |
| දීපාල් | 500 | 200 | 700 |
| එමිල් | 400 | 100 | 500 |
| **එකතුව** | **2 900** | **300** | **3 200** |

හවුල්කරුවන්ට මුදලින් ගෙවූ වේතන පරිපාලන වියදම් ලෙස සටහන් කර ඇති අතර වේතන පියවීම සඳහා වෙළෙඳ භාණ්ඩ නිකුත් කිරීම ගිණුම්ගත කර නොතිබුණි.

(v) 2025.03.31 දිනට පැවැති භෞතික තොගය මත පදනම්ව අවසාන තොගය ආගණනය කර ඇත.

(vi) දීපාල් විසින් ව්‍යාපාරයට ලබාදුන් ඉඩම ඔහුගේ පෞද්ගලික මුදල්වලින් රු. 50 000 ක වියදමක් දරා පිරිසිදු කරන ලදී. මෙම වියදම ව්‍යාපාරයේ පොත්වල ගිණුම්ගත කර නොමැත.

(vii) ඉන්දියාවේ පැවැත් වූ කළමනාකරණ පුහුණු වැඩසටහනකට සීලන්ව යවන ලදී. මෙම පුහුණුවට අදාළ මුළු පිරිවැය වූ රු. 300 000 ක මුදල සීලන් විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් දරන ලදී. හවුල්කරුවන් විසින් මෙම මුදල ඔහුට ප්‍රතිපූර්ණය කිරීමටත් එය හවුල් ව්‍යාපාරයේ වියදමක් ලෙස සැලකීමටත් එකඟ විය.

(viii) හවුල් ව්‍යාපාරය විසින් ප්‍රවර්තන වර්ෂය සඳහා ගිනි රක්ෂණ වාරිකය ලෙස රු. 120 000 ක් ගෙවන ලදී. මෙම මුදල පරිපාලන වියදම් තුළ සටහන් කර ඇත. මෙම රක්ෂණ වාරිකය තුළ එමිල්ගේ නිවසෙහි ගිනි රක්ෂණය සඳහා ගෙවූ රු. 20 000 ක්ද ඇතුළත් වී ඇත. මෙම මුදල ඔහුගෙන් අයකර ගැනීමට හවුල් ව්‍යාපාරය තීරණය කරන ලදී.

**අවශ්‍ය වන්නේ:**

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන්ද ඇතුළුව)

(2) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

(ලකුණු 25 යි)

[තවවැනි පිටුව බලන්න.

Visit EDUHUB

(ආ) 2024.04.01 දින සීමිත ගිහාන් පොදු සමාගම වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. සමාගම විසින් 2024.04.01 දින සාමාන්‍ය කොටස් නිකුත් කරන ලද අතර 2024.09.30 දින 10% බැංකු ණයක් ලබාගන්නා ලදී. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වෙනත් කිසිදු සාමාන්‍ය කොටස් නිකුතුවක් සිදු කර නොමැත. පහත තොරතුරු ප්‍රවර්තන වර්ෂයට අදාළ වේ.

| 2025.03.31 දිනට: | රු.'000 |
|---|---|
| මුළු වත්කම් ........ | 42 000 |
| මුළු හිමිකම ........ | 24 000 |
| මුළු වගකීම් ........ | 18 000 |
| තොගය ........ | 3 016 |
| වෙළෙඳ ණයගැතියෝ ........ | 2 580 |
| මුදල් ........ | 164 |
| **2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | |
| විකුණුම් පිරිවැය ........ | 15 080 |
| මෙහෙයුම් වියදම් (ක්ෂය ද ඇතුළුව) ........ | 2 720 |
| පොලී වියදම ........ | 720 |
| බදු වියදම ........ | 1 080 |

**අතිරේක තොරතුරු:**

- 2025.03.31 දිනට ණය හිමිකම් අනුපාතය 0.60
- ප්‍රවර්තන වර්ෂය සඳහා හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (ROE) 15%
- සාමාන්‍ය කොටස් ගණන 2 000 000
- බැංකු ණය හැර වෙනත් ජංගම නොවන වගකීම් නොමැත.
- සමාගමේ සියලු විකුණුම් ණය පදනමට සිදු කෙරේ.
- ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගමේ එකම ආදායම් ප්‍රභවය විකුණුම් වේ.
- සමාගම විසින් ප්‍රවර්තන වර්ෂය සඳහා රු. 800 000 ක ලාභාංශ ගෙවා ඇත.
- වර්ෂයක් සඳහා දින 360 ක් බව උපකල්පනය කරන්න.

සීමිත ගිහාන් පොදු සමාගමේ තරගකාරී සමාගමක් වන සීමිත කසුන් පොදු සමාගමේ ප්‍රවර්තන වර්ෂයට අදාළ අනුපාත පහත දී ඇත.

| | |
|---|---|
| කොටසක ලාභාංශ (රු.) | 0.30 |
| ජංගම අනුපාතය | 1.80 |
| ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර) | 5.5 |
| තොග රඳවාගැනීමේ කාලය (දින) | 80 |
| දළ ලාභ අනුපාතය | 32% |

**අවශ්‍ය වන්නේ:**

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත ගිහාන් පොදු සමාගමේ බදු පසු ලාභය

(2) ප්‍රවර්තන වර්ෂය සඳහා සීමිත ගිහාන් පොදු සමාගමේ පහත අනුපාත:

(i) කොටසක ලාභාංශ

(ii) ජංගම අනුපාතය

(iii) ණයගැති පිරිවැටුම් අනුපාතය (වසර අග ණයගැති ශේෂය මත පදනම්ව)

(iv) තොග රඳවාගැනීමේ කාලය (වසර අග තොග ශේෂය මත පදනම්ව)

(v) දළ ලාභ අනුපාතය

(3) ඉහත (2) කොටසෙහි ගණනය කරන ලද අනුපාත, සීමිත කසුන් පොදු සමාගමේ දී ඇති අනුපාත සමග සංසන්දනය කරමින් පහත එක් එක් අවස්ථාවට අදාළ සමාගමේ නම හේතුවද සහිතව දක්වන්න.

(i) විකුණුම් මත වඩා ඉහළ ලාභ අනුපාතයක් පවත්වාගනු ලබන සමාගම

(ii) කෙටිකාලීන ණය වගකීම් පියවීම සඳහා වඩා ඉහළ හැකියාවක් ඇති සමාගම

(iii) ණයගැතියන්ගෙන් මුදල් එකතු කරගැනීම වඩාත් කාර්යක්ෂමව සිදු කරනු ලබන සමාගම

(iv) වඩා කෙටි කාලයක් තුළදී තොග විකුණනු ලබන සමාගම

(v) ලාභයෙන් වැඩි කොටසක් අනාගත ආයෝජන සඳහා රඳවාගනු ලබන සමාගම

**(ලකුණු 15 යි)**
**(මුළු ලකුණු 40 යි)**

6. (අ) සීමිත ඩිලාන් පොදු සමාගමේ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා පහත තොරතුරු සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| අත්පිට විකුණුම් ........ | 36 500 |
| විකුණුම් පිරිවැය ........ | 30 000 |
| මෙහෙයුම් වියදම් ........ | 10 000 |
| ගෙවූ පොලී වියදම ........ | 6 000 |
| ආදායම් බදු වියදම ........ | 3 500 |
| කොටස්වල ආයෝජනය සඳහා ගෙවූ මුදල ........ | 12 000 |
| යන්ත්‍රයක් මිලට ගැනීම ........ | 28 000 |
| සාමාන්‍ය කොටස් නිකුත් කිරීම ........ | 25 000 |
| සාමාන්‍ය කොටස්හිමියන් සඳහා ලාභාංශ ........ | 3 000 |



Visit EDUHUB

**අතිරේක තොරතුරු:**

(i) මුළු ජංගම වත්කම් සහ මුළු ජංගම වගකීම් පහත අයිතමවලින් සමන්විත විය.

| | 2025.03.31 දිනට (රු.'000) | 2024.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| තොග | 8 000 | 6 500 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 9 500 | 10 750 |
| මුදල් සහ මුදල් සමාන දෑ | (5 650) | 1 100 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 4 750 | 6 250 |
| උපචිත මෙහෙයුම් වියදම් | 1 000 | 600 |
| ගෙවිය යුතු ආදායම් බදු | 850 | 1 250 |

(ii) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයට විකුණුම් රු. 32 000 000 ක් විය.

(iii) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 4 500 000 ක ක්ෂය වියදම සහ රු. 500 000 ක දුන් වට්ටම්, මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් විය.

(iv) ඉහත සඳහන් කර ඇති රු. 28 000 000 ක් පිරිවැය වූ යන්ත්‍රය සීමිත නලින් පොදු සමාගමෙන් 2024.10.01 දින මිල දී ගන්නා ලදී. මේ සඳහා සමාගම විසින් රු. 20 000 000 ක් මුදලින් ගෙවූ අතර ඉතිරි මුදල පියවීම සඳහා සමාගම විසින් සාමාන්‍ය කොටස් සීමිත නලින් පොදු සමාගම වෙත එදිනම නිකුත් කරන ලදී.

(v) ඉහත සඳහන් කර ඇති රු. 25 000 000 ක සාමාන්‍ය කොටස් නිකුත් කිරීම සමන්විත වන්නේ පහත දෑ වලිනි:

- රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීකරණය කිරීම රු. 12 000 000
- යන්ත්‍රය මිල දී ගැනීම වෙනුවෙන් සීමිත නලින් පොදු සමාගම වෙත නිකුත් කරන ලද කොටස්
- වර්ෂය තුළදී මුදලට සිදුකළ මහජන කොටස් නිකුත් කිරීම

(vi) ඉහත සඳහන් කර ඇති සාමාන්‍ය කොටස්හිමියන් සඳහා ලාභාංශ රු. 3 000 000 පහත පරිදි ගණනය කර ඇත.

| | රු.'000 |
|---|---|
| සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 2 500 |
| සාමාන්‍ය කොටස්හිමියන්ට සඳහා යෝජිත ලාභාංශ | 1 500 |
| කොටස්වල ආයෝජනය කිරීම තුළින් ලද ලාභාංශ | (1 000) |
| | 3 000 |

**අවශ්‍ය වන්නේ:**

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත ඩිලාන් පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (*මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ මුදල් ප්‍රවාහ පෙන්නුම් කිරීමේදී* ***සෘජු ක්‍රමය*** *භාවිත කරන්න*).

**(ලකුණු 20 යි)**

(ආ) 'යුනයිටඩ් ස්පෝර්ට්ස් ක්ලබ්', සිය 50 වන සැමරුම 2026 ජනවාරි මාසයේදී විශේෂ ආරාධිත අමුත්තන් 8 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සැමරීම සඳහා උත්සවයක් සැලසුම් කරයි. මෙම ක්‍රීඩා සමාජය සාමාජිකයන් 75 දෙනෙකුගෙන් සමන්විත වේ. උත්සවය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ශබ්ද විකාශන යන්ත්‍රය කුලියට ගැනීමේ පිරිවැය | 18 000 |
| විශේෂිත ආරාධිත අමුත්තන්ට මල්මාලා | 8 000 |
| සැරසිලි | 8 000 |
| ශාලා ගාස්තුව | 20 000 |
| නර්තන කණ්ඩායමේ පිරිවැය | 12 000 |
| උත්සවය සඳහා වතුර බෝතල් | 11 500 |
| එක් සමරු තිළිණයක පිරිවැය | 2 500 |
| සාමාජිකයකු සඳහා බීම බෝතලයක පිරිවැය | 1 000 |
| සාමාජිකයකු සඳහා ආහාර පැකට් එකක පිරිවැය | 400 |
| සාමාජිකයකු සඳහා ටී-ෂර්ට් එකක පිරිවැය | 1 100 |
| | 1 500 |

**අතිරේක තොරතුරු:**

- ක්‍රීඩා සමාජය විසින් සෑම විශේෂිත ආරාධිත අමුත්තකුටම සමරු තිළිණයක් ලබා දීමට තීරණය කර ඇත.
- උත්සවය සඳහා සහභාගීවන සෑම සාමාජිකයකුම සමරු තිළිණයක් සහ ටී-ෂර්ට් එකක් ලැබීමට හිමිකම් ලබයි.
- උත්සවය සඳහා සහභාගීවන සෑම සාමාජිකයකුගෙන්ම රු. 6 000 ක ගාස්තුවක් අය කිරීමට තීරණය කර ඇත.

**අවශ්‍ය වන්නේ:**

(1) උත්සවයේ මුළු ස්ථාවර පිරිවැය
(2) සාමාජිකයකු සඳහා විචල්‍ය පිරිවැය
(3) සාමාජිකයකු සඳහා දායකය
(4) උත්සවයේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා එයට සහභාගි විය යුතු සාමාජිකයන් ගණන
(5) උත්සවය සඳහා සාමාජිකයන් 60 දෙනෙකු සහභාගි වන්නේ නම් අපේක්ෂිත අතිරික්තය
(6) විශේෂ ආරාධිත අමුත්තන්ට පිරිනමන සමරු තිළිණ සඳහා අනුග්‍රාහකත්වයක් ලැබෙන්නේ නම්, උත්සවයේ මුළු පිරිවැය ආවරණය කරගැනීමට සහභාගී විය යුතු සාමාජිකයන් ගණන
(7) රු. 20 000 ක පරිත්‍යාගයක් ලැබේ නම් සහ උත්සවය සඳහා සාමාජිකයන් 50 දෙනෙකු සහභාගී වන්නේ නම් මුළු පිරිවැය ආවරණය කරගැනීම සඳහා සාමාජිකයකුගෙන් අයකළ යුතු ගාස්තුව

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

* * *

Visit EDUHUB